# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 51 දරන
# ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ
# අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 අගෝස්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 3.00 යි

තැ. පැල් ගාස්තුව : රු. 1.00 යි

# 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1979 ජූලි මස 30 වන දින]

එල්.ඩී.—ඕ. 39/78.

කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වරායවල සහ මේ පනත අදාළ විය යුතු වරායක් ලෙස අමාත්‍යවරයා විසින් නියමයක් මගින් මින් මතු ප්‍රකාශ කරනු ලබන වෙනත් යම් වරායක වරාය සේවා සහ වෙනත් සේවා සංවර්ධනය කිරීම, පවත්වා ගෙනයාම, මෙහෙයවීම සහ සැපයීම පිණිස ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පිහිටුවීම සඳහා ද වරාය කොමසාරිස්වරයාගේ, වරාය (නැව්බඩු) සංස්ථාවේ හා වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ බලතල, කර්තව්‍ය හා කාර්ය සහ ඒ අධිකාරිය වෙත නීතියෙන් පවරනු ලබන, වෙන් කරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් බලතල, කර්තව්‍ය හා කාර්ය ඒ අධිකාරිය විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටුකිරීම සඳහා ද; වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ නිලධරයන් හා සේවකයන්, දේපළ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් සහ වරාය කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන්, ඒ දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන දේපළ සහ ඒ දෙපාර්තමේන්තුවේ අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් යන මේවාට අදාළ කරුණු සඳහා ද (238 වන අධිකාරය වූ) කොළඹ වරාය (පරිපාලන) පනත, 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංස්ථා පනත සහ 1967 අංක 10 දරන වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථා පනත ඉවත් කිරීම සඳහා ද ඇතැම් නීති කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වරායවල් සහ මේ පනත අදාළ විය යුතු වරායක් ලෙස අමාත්‍යවරයා විසින් නියමයක් මගින් මින් මතු ප්‍රකාශ කරනු ලබන වෙනත් යම් වරායක් සම්බන්ධයෙන් අදාළ වන තාක් දුරට ඇතැම් නීති සුළුවෙන් වෙනස් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.

1. මේ පනත 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මේ පනතෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කෙරෙන) දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

මේ පනත අදාළ වන වරායවල්.

2. (1) කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වරායවල, වරායවලට සහ වරායවල් සම්බන්ධයෙන් සහ මේ පනත අදාළ විය යුතු වරායක් ලෙස ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් මින් මතු ප්‍රකාශ කරනු ලබන වෙනත් යම් වරායක, වරායකට හා වරායක් සම්බන්ධයෙන්, මේ පනත අදාළ විය යුතු ය.

(2) මේ පනත අදාළ විය යුත්තේ යම් වරායවලට ද යම් වරායවල් සම්බන්ධයෙන් ද ඒ වරායවල් "නිශ්චිත වරායවල්" යනුවෙන් මේ පනතෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

(3) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍ය වරයා විසින් යම් නිශ්චිත වරායක සීමා කලින් කල නිර්නය කර දැක්විය හැකි ය.

1—ඒ 41923—13,000 (79/05)

(4) යම් නිශ්චිත වරායක් සම්බන්ධයෙන් (3) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලබනතුරු, නියමිත දිනයට ඉහතින් ම වූ දිනයේ පැවති නිශ්චිත වරායවල සීමා—

(අ) නාවික හමුදා පනත යටතේ නාවික වරායවල් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති වරායවල් සඳහා නිර්නය කරනු ලැබූ සීමා තුළ වූ ප්‍රදේශ; සහ

(ආ) ඒ නිශ්චිත වරායවල සීමා තුළ ශ්‍රී ලංකා රේගුවට අයත් ඉඩම්, ගොඩනැගිලි හා වෙනත් දේපළ

හැර, නිශ්චිත වරායවල සීමා විය යුතු ය.

## I වන කොටස

## ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරියේ සංයුතිය සහ එහි බලතල, කර්තව්‍ය සහ කාර්ය

ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය.

3. මේ පනතෙහි මින් මතු "වරායවල් පිළිබඳ අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන්නා වූ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු අතර, 5 වන වගන්තිය යටතේ තත් කාලයෙහි ඒ අධිකාරියේ සාමාජිකයන්ව සිටින තැනැත්තන්ගෙන් එය සමන්විත විය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය සංස්ථාවක් විය යුතු බව.

4. වරායවල් පිළිබඳ අධිකාරිය 3 වන වගන්තියෙන් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර එයට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තවද එය විසින් හා එයට විරුද්ධව ඒ නාමයෙන් නඩු පවරනු ලැබිය හැකි ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකත්වය.

5. (1) වරායවල් පිළිබඳ අධිකාරිය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) වරාය සංවර්ධනය හෝ වරාය මෙහෙයවීම් හෝ නෛතික හෝ මූල්‍ය කරුණු, හෝ නැව්ගත කිරීමේ, වාණිජ හෝ ඉංජිනේරු කටයුතු, හෝ පරිපාලනය හෝ කම්කරු සම්බන්ධතා හෝ පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇතැයි සහ නිපුණත්වයක් දක්වා ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සභාපතිවරයා සහ එසේම පත් කරනු ලැබිය යුතු වෙනත් සාමාජිකයන් පස් දෙනෙක් ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මහා භාණ්ඩාගාරයේ නියෝජිතයෙක් ;

(ඇ) ප්‍රධාන රේගු අයකැමි ; සහ

(ඈ) ධීවර කටයුතු විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා භාරයේ ඇති අමාත්‍යාංශයේ, ඒ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, නියෝජිතයෙක්.

(2) (1) (අ) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සාමාජිකයන් අතුරෙන් සභාපතිවරයා නොවන සාමාජිකයකු වරායවල් පිළිබඳ අධිකාරියේ උප සභාපතිවරයා වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) මේ පනතේ I වන උපලේඛනයේ විධිවිධාන වරායවල් පිළිබඳ අධිකාරිය සම්බන්ධයෙන් බලපැවැත්විය යුත ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ පරමාර්ථ සහ කාර්ය.

6. (1) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන කටයුතු කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය සතු කාර්යය විය යුතු ය :—

(අ) ස්ටෙවඩෝරු වැඩ, ලයිටර් කටයුතු, නැව් ගත කිරීම, නැව කින් නැවකට බඩු මාරුකිරීම, වියළි සහ තෙත් නැව්බඩු හා තොග වශයෙන් වූ නැව්බඩු ගොඩබෑම හා ගුදම් කිරීම සඳහා ද වාප්පු වැඩ, යාත්‍රාවලට ජලය, ඉන්ධන හා විදුලිය බලය සැපයීම සඳහා ද, ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ලිහිස්සි තෙල් යාත්‍රාවලට හා යාත්‍රාවලින් ද බන්කර හා ගබඩා අතර ද ගෙනයාම හා ගෙන ඒම පිළිබඳ කටයුතු කිරීම සඳහා ද යාත්‍රාවල නියමු කාර්ය හා යාත්‍රාවලට නැංගුරම්ලෑම සඳහා ද කිමිදීම හා ජලය යට නැව් අලුත්වැඩියා කිරීම සඳහා ද යම් නිශ්චිත වරායක කාර්යක්ෂම හා අඛණ්ඩ සේවා සැපයීම හා එකී කරුණුවලට ආනුෂංගික වන වෙනත් සේවා සඳහා ද විධිවිධාන සැලැස්වීම ;

(ආ) යම් නිශ්චිත වරායක කාර්යක්ෂම හා අඛණ්ඩ සැසඳුම් හා ආරක්ෂක සේවාවන් සැපයීම ;

(ඇ) නිශ්චිත වරායවල සීමා තුළ හා එවැනි වරායවල ප්‍රවේශ මාර්ගවල යාත්‍රාකරණය විධිමත් කිරීම සහ පාලනය කිරීම ;

(ඈ) වරාය ස්ථාපනයන් නඩත්තු කිරීම සහ නිශ්චිත වරායවල් පාවිච්චි කිරීම සහ ඒවායේ දියුණුව හා සංවර්ධනය නංවාලීම ;

(ඉ) රේගුවේ කාර්ය හැර, යම් නිශ්චිත වරායක් තුළ, සියලු කටයුතු සම්බන්ධීකරණය කිරීම හා විධිමත් කිරීම ;

(ඊ) නිශ්චිත වරායවල් තුළ සහ නිශ්චිත වරායවලින් පිටතට යාත්‍රාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රදීප හෝ වෙනත් උපක්‍රම, යාත්‍රාවලට මගපෙන්වීම සහ යාත්‍රාවල ආරක්ෂාව සඳහා, ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළෙහි සහ තදාසන්නයෙහි, පිහිටුවා පවත්වා ගෙන යෑම ;

(උ) වරායවල් පිළිබඳ අධිකාරියට මෙම පනත මගින් නියම කරනු ලැබ ඇති වෙනත් කාර්ය ඉටු කිරීම ;

(ඌ) වත්කම් ප්‍රතියෝජනය කිරීම පිණිසත්, නව ආයෝජන කිරීම පිණිසත්, ප්‍රමාණවත් පොදු සංචිතයක් පිහිටුවා පවත්වා ගෙන යාම පිණිසත් අධිකාරියේ ආදායමට ගෙවනු ලැබීමට සුදුසු ගාස්තු ගෙවනු ලැබීම සඳහා සෑහෙන්නා වූ ආදායමකට නොඅඩු ආදායමක් අධිකාරියට ලැබෙන ආකාරයකින් වරායවල් පිළිබඳ අධිකාරියේ කටයුතු පවත්වා ගෙන යනු ලැබීම සහ ඉහත කී ආකාරයේ ගාස්තු, අධිකාරිය විසින් සපයනු ලබන සේවා වෙනුවෙන් මේ පනතට අනුකූලව අයකර ගනු ලැබීම ; සහ

(එ) නිශ්චිත වරායවල් සහ ඒ එක් එක් වරාය ස්වයංපෝෂක ව්‍යවසායක් ලෙස මේ පනතේ විධිවිධානවලට අනුකූලව කළමනාකරණය කරගෙන යාමට උත්සාහ දැරීම.

(2) (1) වන උපවගන්තියේ (අ) හා (ආ) ඡේද යටතේ සපයනු ලබන සේවා "වරාය සේවා" යනුවෙන් මේ පනතෙහි මින් මතු සඳහන් කරනු ලැබේ.

(3) යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරිපිට පැවැත්වෙන නඩු කටයුතු මගින් ක්‍රියාත්මක කළ හැකිවන්නා වූ ද අධිකාරිය අත්‍යාකාරයකින් යටත්ව නොමැත්තා වූ ද යම් ආකාරයක කාර්යයක් හෝ වගකීමක් කෙළින් ම හෝ අන් අයුරකින් හෝ වරායවල් පිළිබඳ අධිකාරිය කෙරෙහි නියම කරන්නක් ලෙස (1) වන උපවගන්තිය තේරුම් ගනු නොලැබිය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය සතු බලතල.

7. (1) මේ පනතට යටත්ව වරායවල් පිළිබඳ අධිකාරිය විසින් පහත දැක්වෙන බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය :—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම, බද්දට දීම, කුලියට දීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ වෙනත් ලෙසකින් බැහැර කිරීම;

(ආ) අධිකාරියේ වැඩ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය වන නිලධරයන් හා සේවකයන් සේවයෙහි නියුක්ත කර ගැනීම;

(ඇ) අධිකාරියේ වැඩ කටයුතු කරගෙන යෑමට අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා පහසුකම් අධිකාරිය විසින් සැපයීම හා වෙනත් අය විසින් සපයනු ලැබීමට සහාය වීම ද ඇතුළුව, වරාය ක්‍රියා කරවීමේ කාර්යක්ෂමතාව දියුණු කිරීමේ හා අධිකාරිය විසින් සේවයේ නියුක්ත කර ගනු ලැබ සිටින තැනැත්තන්ගේ නිපුණතාව හෝ අධිකාරියේ උපකරණවල කාර්යක්ෂමතාව හෝ උපකරණ ක්‍රියාකරවනු ලබන ආකාරය හෝ වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ඕනෑම දෙයක් කිරීම;

(ඈ) අධිකාරියේ සේවයේ නියුක්ත කරගනු ලැබ සිටින තැනැත්තන් සඳහා, රක්ෂණ ක්‍රමයක්, අර්ථසාධක අරමුදලක්, ශුභසාධක අරමුදලක් සහ දඩ අරමුදලක් පිහිටුවීම සහ ශුභ සාධක, සෞඛ්‍ය හා විනෝද ක්‍රීඩා පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් එවැනි අනුග්‍රහ සැපයීම;

(ඉ) නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමිකය, විනය, පැවැත්ම, නිවාඩු, වැඩ කිරීමේ කාලවේලා, ප්‍රසිද්ධ නිවාඩු සහ ඔවුනට ණය සහ වැටුප් අත්තිකාරම් දීම ද ඇතුළුව අධිකාරියේ නිලධරයන්ට හා සේවකයන්ට අදාළ රීති සෑදීම;

(ඊ) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමට අදාළ රීති සෑදීම සහ කාර්ය පටිපාටි නියම කිරීම;

(උ) ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම ලෙස කරගෙන යෑම පිණිස අධිකාරියේ සභාපතිවරයාට හෝ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට පැවරීම අවශ්‍ය යයි අධිකාරිය කල්පනා කරන කටයුතු කිසිවක් එසේ පැවරීම;

(ඌ) යම් නිශ්චිත වරායක් ඇතුළත මරාය ස්ථාපනයන්, උපකරණ, නැව්බඩු සහ යාත්‍රා ආරක්ෂා කිරීම සඳහා සහ මේ පනතේ විධිවිධාන බලගැන්වීම පිණිස ඒ වරායේ සීමා තුළ ආරක්ෂක සේවයක් පිහිටුවීම, පවත්වාගෙන යෑම සහ මෙහෙය වීම ;

(එ) යම් නිශ්චිත වරායක බඩු පැටවීම සහ බෑම හෝ ගුදම් කිරීම හෝ එම වරායෙහි දී යාත්‍රාවලට ඉන්ධන සැපයීම සඳහා පහසුකම් සලස්වන යම් ව්‍යාපාරයක් අත්කර ගැනීම ;

(ඒ) යාත්‍රා සහ යන්ත්‍රසූත්‍ර තනන්නන්ගේ සහ අලුත්වැඩියා කරන්නන්ගේ ද සුන් බුන් ඉවත් කරන්නන්ගේ හෝ ගොඩගසන්නන්ගේ ද, නැව් කඩන්නන්ගේ ද, ගොඩ බිමින් හෝ මුහුදින් මගින්, වාහන හා බඩු ගෙන යන්නන් ගේ ද ස්ටෙවඩෝරු කම්කරුවන්ගේ, වාප්පුහිමියන්ගේ, ගුදම්කරුවන්ගේ, බත්තල්කරුවන්ගේ, රට අඟුරු හා වෙනත් ඉන්ධන වර්ග වෙළෙඳුන්ගේ, නැව්වලට ජලය හා ගබඩා බඩු සපයන්නන්ගේ සහ ඉහත කී යම් කටයුතු වලට සම්බන්ධ හෝ ඒ සඳහා අවශ්‍ය ගබඩා බඩු හා උප කරණ වෙළෙඳුන්ගේ ද කර්තව්‍ය කරගෙන යෑම;

(ඔ) යම් නිශ්චිත වරායක සීමා තුළ දුම්රිය ප්‍රවාහණ ක්‍රමයක් මෙහෙයවීම හා පවත්වාගෙන යෑම;

(ඕ) යම් නිශ්චිත වරායක සීමා ඇතුළත නැව් තොටෙහි හෝ ජේවා යම් ජැටියක, වාප්පුවේ, ගොඩබසින හා ගොඩ බාන පාළමේ හෝ ගොඩබසින හා ගොඩබාන ස්ථානයේ ප්‍රවේශ මාර්ගවල හෝ එකී ස්ථාන අද්දර හෝ සියලු යාත්‍රා ලැගුම් කිරීම හෝ යාත්‍රා එහා මෙහා යාම සම්බන්ධයෙන් පාලනය කිරීම හා යාත්‍රා යම් නිශ්චිත වරායකට හරවා යැවීම ;

(ක) අධිකාරියේ කාර්ය ඉටුකිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට, කෙළින්ම හෝ අධිකාරිය විසින් ඒ සඳහා බලය දෙනු ලබන යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ ඇතු ළත් වීම සහ ඒවා ඉටු කිරීම ;

(ග) මේ පනතට යටත්ව, යම් නිශ්චිත වරායක සීමා තුළ යාත්‍රා, බඩු හා වාහන වෙනුවෙන් හා සේවා වෙනුවෙන් ද එම වරාය තුළ පටවනු ලබන, බානු ලබන හෝ තබනු ලබන නැව්බඩු වෙනුවෙන් ද එය විසින් අවශ්‍ය යයි සලකනු ලබන වරාය බදු, ගාස්තු සහ වෙනත් අය කිරීම් අයකර ගැනීම ;

(ච) යම් නිශ්චිත වරායක් තුළ යාත්‍රා ලැගුම් කිරීම, යාත්‍රාවලට බඩු පැටවීම සහ නැංගුරම් ලීයීම් සඳහා වූ සියලු උපක්‍රම සහ උපකරණ තැනීම, නඩත්තු කිරීම සහ මෙහෙය වීම ;

(ජ) ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය තුළ හෝ නො එසේව යාත්‍රා ආරක්ෂා කිරීමේ, යාත්‍රාවලට මග පෙන්වීමේ සහ යාත්‍රා සමඟ පණිවුඩ හුවමාරු කර ගැනීමේ කාර්යය සඳහා හෝ යම් යාත්‍රාවක් ඇදගෙන යෑමේ සහ යම් යාත්‍රාවකට ආධාර කිරීමේ කාර්යය සඳහා හෝ නැතිවුණු, දියෙහි ගිලුණු හෝ

අතරමං වුණු යම් දේපළක් සොයා ගැනීම සඳහා සහ බේරා ගැනීම සඳහා යාත්‍රා සහ උවාරණ සැපයීම සහ පාවිච්චි කිරීම ;

(ට) ගොඩබිමේ, මුහුදේ හෝ දියඹ නැව්වල ගිනි නිවීමේ කාර්යය සඳහා හා ජීවිත හා දේපළ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් නිශ්චිත වරායක් හා මහ මුහුද යන උභය ස්ථානයෙහි අධිකාරිය අවශ්‍ය යයි සලකන ගිනි නිවීමේ සේවා සැප යීම ;

(ඩ) යම් නිශ්චිත වරායක බඩු කිරන්නන්, මනින්නන් හා සමීක්ෂකයන් පත් කිරීම, ඔවුනට බලපත්‍ර දීම හා ඔවුන් පාලනය කිරීම ;

(ණ) අධිකාරියේ ස්ථානයෙහි ඇත්තාවූ බඩු රක්ෂණය කිරීමට කටයුතු පිළියෙළ කිරීම ;

(ත) මේ පනතට යටත්ව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් තැනැත්තකුගෙන්, සංවිධානයකින් හෝ ආයතනයකින් හෝ ආණ්ඩුවෙන් (අසිරා අණකර වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින්) මුදල් ණයට ගැනීම ;

(ද) යම් නිශ්චිත වරායක සීමා තුළ ක්‍රියා කරවන්නා වූ සියලු කුඩා යාත්‍රා, උපකරණ, වාහන සහ සේවා පාවිච්චි කිරීම, පාලනය කිරීම හා ඒවා වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම ;

(න) ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථා සඳහා සහ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් මණ්ඩල සඳහා සාමුද්‍රිය ඉංජිනේරු කර්මාන්ත සමීක්ෂණය කිරීම, සැලසුම් කිරීම හා ක්‍රියාවෙහි යෙදවීම ;

(ප) යම් නිශ්චිත වරායක යම් කොටසක් සුද්ධ කිරීම, ගැඹුරු කොට සෑරීම හෝ දියුණු කිරීම සහ එවැනි කවර හෝ කාර්යයක් සඳහා මඩ ගොඩ දමන යාත්‍රා හා වෙනත් උවාරණ තැනීම, පවත්වාගෙන යෑම හා මෙහෙයවීම සහ ජල විද්‍යාත්මක සමීක්ෂණ පැවැත්වීම ;

(බ) යම් නිශ්චිත වරායක සීමා තුළ පිහිටි හෝ අධිකාරියට අයත් යම් ප්‍රදේශයක් ගොඩ කිරීම, කොටු කිරීම, ඉස්සීම, ජලාප වහනය කිරීම සහ එහි පස් කැපීම ;

(ම) යම් නිශ්චිත වරායක සීමා තුළ හෝ එහි ප්‍රවේශ මාර්ග ඇතුළත ගොඩබසින හෝ ගොඩබාන පාලම්, දියකඩන, පාලම්, විජ්ජු, තටාක, ගුදම්, ගබඩා, කාර්යාල, වෙළෙඳසැල්, වාසස්ථාන හා වෙනත් යම් ගොඩනැගිලි හෝ කර්මාන්ත ශාලා පවත්වාගෙන යෑම, අලුත්වැඩියා කිරීම, ඉදිකිරීම, ඉදිකරනු ලැබීමට සැලැස්වීම හා ඒවා ඉදිකිරීම හා පාවිච්චි කිරීම, පාලනය කිරීම සහ වේලාන්ත ප්‍රදීප ද යාත්‍රා ආරක්ෂා කිරීමේ හා යාත්‍රාවලට මගපෙන්වීමේ වෙනත් උපක්‍රම ද ස්ථාපනය කිරීම හා පවත්වාගෙන යෑම ;

(ශ) යම් නිශ්චිත වරායක සීමා තුළ හෝ එහි ප්‍රවේශ මාර්ග ඇතුළත පහත දක්වෙන සේවා සැපයීම හෝ සපයනු ලැබීමට සැලැස්වීම :—

(i) නියමු කාර්ය ඇතුළුව යම් යාත්‍රා ඇඟුම් කිරීම, ඇදගෙන යාම, නැංගුරම්ලීම, ඔබමොබ කිරීම, දියත් කිරීම හෝ තටාකගත කිරීම ;

(ii) සියලු උපකාරක සේවා ඇතුළුව යම් යාත්‍රාවකට බඩු පැටවීම හෝ යම් යාත්‍රාවකින් බඩු බෑම ;

(iii) යම් බඩු තෝරීම, කිරීම, මැනීම, ගබඩා කිරීම, ගුදම් කිරීම හෝ ඒ පිළිබඳව අන්‍යාකාරයකින් පරිහරණය කිරීම ;

(iv) නිශ්චිත වරායවල් අතර සහ නැව් හා ඒ වරායවල් අතර ගුවන් විදුලි පණිවුඩ හුවමාරුව ;

(v) වරාය පාවිච්චි කරන්නන් සඳහා සහ අධිකාරියේ සේවානියුක්තයන් සඳහා ප්‍රවාහණ සේවා හා වෙනත් පහසුකම් ;

(vi) යාත්‍රාවලට හා යාත්‍රාවල සිට සහ සියලු ගබඩා හා බන්කර අතර ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ලිහිස්සි තෙල් ගෙන යාම පිළිබඳ කටයුතු ;

(vii) යාත්‍රාවලට විදුලි බලය හා දුරකථන සේවා සැපයීම ;

(viii) නැව්වලින් කුණු කසල බැහැර කිරීම ; සහ

(ix) සැඟවුම් හා ආරක්ෂක සේවා ;

(අඇ) අධිකාරියේ කටයුතු සඳහා අවශ්‍ය කවර දෙයක් වුව ද තැනීම, නිෂ්පාදනය කිරීම, මිලට ගැනීම, මෙහෙයවීම, නඩත්තු කිරීම සහ අලුත්වැඩියා කිරීම ;

(අආ) යම් නිශ්චිත වරායක නිදහස් වෙළෙඳ කලාපයක් පිහිටුවීමට අදාළ ආණ්ඩුවේ කවර යෝජනා ක්‍රමයක් වුවද සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාවේ යෙදවීම සහ එවැනි පහසුකම් උපයෝගි කර ගැනීම සඳහා වරාය පාවිච්චි කරන්නන් සමග යම් එකඟවීමකට ඇතුළත්වීම ;

(අඇ) යම් නිශ්චිත වරායක සීමා තුළට වාහන, තැනැත්තන්, බඩු සහ සතුන් ඇතුළුකරවීම, පාලනය කිරීම සහ එකී සීමා ඇතුළත එම වාහන ද තැනැත්තන් ද බඩු හා සතුන් ද එහා මෙහා කිරීම විධිමත් කරනු ලැබීම ;

(අඈ) මේ පනත යටතේ අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය හා කාර්ය ඉටුකිරීම සඳහා හෝ ඒ සම්බන්ධයෙන් හෝ තමා විසින් කර ගෙන යාම වැඩදායකයයි, අවශ්‍ය යයි හෝ පහසුවක් වෙතැයි අධිකාරියට පෙනී යන එවැනි වෙනත් කටයුතුවල යෙදීම සහ එවැනි වෙනත් දේවල් කිරීම ; සහ

(අඉ) අධිකාරියේ කටයුතු කරගෙන යාම සඳහා අධිකාරියේ මතය අනුව අවශ්‍ය එකී වෙනත් සියලු දේවල් කිරීම.

(2) තත් කාලයෙහි වලංගුව පවත්නා යම් නීතියක් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නොසලකා හරිනු ලැබීමට බලය දෙන්නක් ලෙස (1) වන උපවගන්තියෙහි විධිවිධාන තේරුම් නොගත යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.

8. (1) ජාතික යහපත කෙරෙහි බලපාන බවට තමාට පෙනී යන කරුණු සම්බන්ධයෙන් මේ පනත යටතේ වරායවල් පිළිබඳ අධිකාරිය සතු කාර්ය ඉටුකිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් වරායවල් පිළිබඳ අධිකාරියට සාමාන්‍ය හෝ විශේෂ විධාන දිය හැකි අතර අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ දේපළ සහ කටයුතු පිළිබඳ වාර වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු තමා නියම කරන ආකෘතියකින් තමා වෙත සපයන ලෙස අමාත්‍යවරයා විසින් වරායවල් පිළිබඳ අධිකාරියට කලින් කල විධාන කළ හැකි අතර අධිකාරිය විසින් එවැනි සෑම විධානයක් ම ක්‍රියාත්මක කළ යුතු ය.

(3) වරායවල් පිළිබඳ අධිකාරියේ සියලු කටයුතු හෝ ඉන් යම් කටයුත්තක් හෝ තමා විසින් නියම කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් විමර්ශනය කොට, වාර්තා කරනු ලැබිය යුතු යයි අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් කරනු ලැබූවිට, ඒ නියමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු පහසුකම් සැලැස්වීමත් සියලු තොරතුරු සැපයීමත් අධිකාරිය විසින් කළ යුතු ය.

ගිණුම් පිළිබඳව වගකියන නිලධරයා.

9. සභාපතිවරයා වරායවල් පිළිබඳ අධිකාරිය සඳහා සහ වෙනුවෙන් ගිණුම් පිළිබඳව වගකියන නිලධරයා විය යුතු අතර අධිකාරියේ කටයුතු පිළිබඳ පරිපාලනය සම්බන්ධයෙන් ද ඔහු වගකිව යුතු ය.

සභාපතිවරයාට බලතල පැවරීම සහ සභාපතිවරයා විසින් සේවා නියුක්තයන්ට බලතල පැවරීම.

10. (1) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ වූ ස්වකීය බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සභාපතිවරයාට ලියවිල්ලකින් පැවරිය හැකි ය.

(2) සභාපතිවරයා විසින්, අධිකාරියේ ලිඛිත අනුමතය ඇති ව, ස්වකීය බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් කිසිවක් අධිකාරියේ යම් සේවා නියුක්තයකුට ලියවිල්ලකින් පැවරිය හැකි ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි කාර්ය සඳහා රජයේ සේවකයන් විය යුතු බව.

11. වරායවල් පිළිබඳ අධිකාරියේ සියලු සාමාජිකයන්, නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව හා කාර්යයන් සඳහා රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

12. වරායවල් පිළිබඳ අධිකාරිය අල්ලස් පනතෙහි අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ පනතෙහි විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

## II වන කොටස

### වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලය

13. (1) වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, ලියවිල්ලකින් ලබන ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, ප්‍රවීණ හා පළපුරුදු තැනැත්තකු සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් පත් කරනු ලැබිය හැකිය.

සාමාන්‍යාධිකාරි වරයා.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ කටයුතු මෙහෙයවීම ද වරායවල් පිළිබඳ අධිකාරිය සංවිධානය කිරීම ද එහි බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය ඉටු කිරීම හා කර්තව්‍ය කිරීම ද ඒ අධිකාරියේ සේවා නියුක්ත යන් පිළිබඳ පරිපාලනමය පාලනය ද සභාපතිවරයාගේ විශේෂ විධානවලට හා ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාන්‍ය විධානයට යටත්ව සාමාන්‍යාධිකාරි වරයාට භාර කරනු ලැබිය යුතු ය.

(3) තමාගේ බලතල, කර්තව්‍ය හෝ කාර්ය අතුරින් වරායවල් පිළිබඳ අධිකාරියේ වෙනත් යම් සේවා නියුක්තයකුට පැවරීම අවශ්‍ය යයි සාමාන්‍යාධිකාරිවරයා කලින් කල සලකන බලතල, කර්තව්‍ය හෝ කාර්ය, ලියවිල්ලකින් ලබන ලද වරායවල් පිළිබඳ අධිකාරියේ අනුමතය ඇතිව, සාමාන්‍යාධිකාරිවරයා විසින් ලියවිල්ලකින්, ඒ සේවා නියුක්තයාට පැවරිය හැකි අතර, එකී බලතල, කර්තව්‍ය හෝ කාර්ය එසේ පවරනු ලැබූ යම් සේවා නියුක්තයකු විසින් සාමාන්‍යාධිකාරිවරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒවා ක්‍රියාත්මක කළ යුතු ය.

(4) අමාත්‍යවරයාගේ පූර්ව අනුමතය නොමැතිව සාමාන්‍යාධිකාරි වරයා ධුරයෙන් ඉවත් නොකරනු ලැබිය හැකි ය.

(5) සාමාන්‍යාධිකාරිවරයා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටිනම් හෝ රෝගාතුරවීම නිසා තාවකාලිකව අබලව සිටී නම් හෝ වෙනත් හේතු නිසා ස්වකීය කාර්ය ඉටුකිරීමට තාව කාලිකව නොහැකි නම්, ඔහුට නැවත තම කාර්ය ඉටු කිරීමට හැකි වන තුරු සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් ක්‍රියා කිරීම පිණිස, වරාය වල් පිළිබඳ අධිකාරිය විසින්, ලියවිල්ලකින් ලබන ලද අමාත්‍ය වරයාගේ අනුමතය ඇතිව, වෙනත් තැනැත්තකු පත්කරනු ලැබිය හැකිය.

14. (1) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සුදුසුකම් ලත්, ප්‍රවීණ හා පළපුරුදු තැනැත්තකු මුදල් කළමනාකාරවරයා වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

මුදල් කළමනාකාර වරයා.

(2) මුදල් කළමනාකාරවරයා විසින් වියදම් පිළිබඳ සියලු මූල්‍ය බලපෑම් දැක්වෙන මුදල් විග්‍රහයක් ඉදිරිපත් කරනු ලබනහොත් මිස වරායවල් පිළිබඳ අධිකාරිය විසින් රුපියල් දස ලක්ෂයකට වඩා අඩු මුදල් ප්‍රමාණ සම්බන්ධයෙන් මුදල් ස්වභාවයේ තීරණ නොගනු ලැබිය යුතු ය.

ඒකාබද්ධ සේවයකට අයත් නොවන කොළඹ වරාය කොමිෂන් සභාවේ නිලධරයන් වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවයේ නියුක්තවීම.

15. (1) ආණ්ඩුවේ ඒකාබද්ධ සේවයකට අයත් නොවන්නාවූ ද නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි සේවයේ යෙදී සිටියාවූ ද, කොළඹ වරාය කොමිෂන් සභාවේ සෑම රජයේ නිලධරයකුට ම අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තිය පිරිනැමිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් රජයේ නිලධරයකු වරාය වල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තිය පිළිගන්නා අවස්ථාවක—

(අ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි, කොළඹ වරාය කොමිෂන් සභාවේ ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් බවට ප්‍රකාශිත තනතුරක් වී නම්—

(i) ඔහු වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියෙහි යෙදී සිටින තාක් කල් එවැනි තන තුරක් ඔහු නොකඩවා දරන ලෙස ඒ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා සලකනු ලැබිය යුතු අතර අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියේ ඔහුගේ සේවය ආණ්ඩුව යටතේ කරන ලද සේවය වූවාක් මෙන් විශ්‍රාම වැටුපක් හෝ පාරිතෝෂිකයක් ලැබීම සඳහා ඔහු සුදුස්සකු විය යුතු ය;

(ii) ඔහු වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියෙහි යෙදී සිටින කාලය තුළ සෑම සම් පූර්ණ මාසයක සේවය වෙනුවෙන්, නියමිත දින යට ඉහතින් ම වූ දිනයෙහි කොළඹ වරාය කොමි ෂන් සභාවේ ඔහු දැරූ ස්ථිර තනතුරෙහි දී ඔහුට ගෙවිය යුතු වැටුපෙන් මුදල් විෂයය භාර අමාත්‍ය වරයා විසින් නිශ්චය කරනු ලබන සියයට විසි පහක් නොඉක්මවන මුදලක් ඔහු සම්බන්ධයෙන්, ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබීම පිණිස අධිකාරිය විසින් අධිකාරියේ මුදලෙන් භාණ්ඩා ගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු ය; තව ද

(iii) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි කොළඹ වරාය කොමිෂන් සභාවේ ඔහු දැරූ ස්ථිර තන තුරෙහි ඔහුට හිමි වැටුප් වර්ධක කිසිවක් වී නම් ඒ වැටුප් වර්ධක වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියේ කාලය තුළ දී ඔහු විසින් උපයා ගන්නා ලද ලෙස ඉහත දැක්වෙන (i) වන සහ (ii) වන අනුඡේදවල කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය. එසේ සලකනු ලැබිය යුත්තේ ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වූ බවත් ඔහුගේ වැටුප් වර්ධක ඔහු උපයාගෙන ඇති බවත් අධිකාරිය සහතික කරන්නේ නම් පමණකි.

(ආ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකුව සිටියේ නම්—

(i) ඔහු වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියෙහි යෙදී සිටින තාක් කල් නොකඩවා එවැනි දායකයකුව සිටින ලෙස ඒ ආඥාපනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු අතර අධිකාරිය යටතේ ඔහුගේ තාවකාලික සේවා නියුක්තිය ආණ්ඩුව යටතේ කරන ලද සේවයක් වූවාක් මෙන් ඒ ආඥාපනත යටතේ යම් ප්‍රදානයක් පිරිනමනු ලැබීම සඳහා ඔහු සුදුස්සකු විය යුතුය.

(ii) ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත්ව සිටි දායක මුදල්, වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියෙහි තමා යෙදී සිටින කාලය තුළ ඔහු විසින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය.

(iii) ඔහු සම්බන්ධයෙන්, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට ආණ්ඩුව යටත්ව ඇති දායක මුදලට සමාන මුදලක්, ඒ අරමුදලේ ඒ නිලධරයාගේ ගිණුමට බැරකරනු ලැබීම පිණිස, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අධිකාරියේ අරමුදල්වලින් එක් එක් මුදල් වර්ෂය අවසානයේදී භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතුය ; තවද

(iv) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි කොළඹ වරාය කොමිෂන් සභාවේ ඔහු දරූ ස්ථිර තනතුරෙහි ඔහුට හිමි වැටුප් වර්ධක කිසිවක් වී නම් ඒ වැටුප් වර්ධක වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තියේ කාලය තුළ දී ඔහු විසින් උපයා ගන්නා ලද ලෙස ඉහත දැක්වෙන (i) වන සහ (ii) වන අනුච්ඡේදවල කාර්යය සඳහා සලකනු ලැබිය යුතුය. එසේ සලකනු ලැබිය යුත්තේ ඔහුගේ වැඩ සහ හැසිරීම සතුටුදායක වූ බවත් ඔහුගේ වැටුප් වර්ධක ඔහු උපයාගෙන ඇති බවත් වරායවල් පිළිබඳ අධිකාරිය සහතික කරන්නේ නම් පමණකි.

(3) වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තිය නොපිළිගන්නා (1) වන උපවගන්තියෙහි සඳහන් සෑම රජයේ නිලධරයකුම නියමිත දිනයෙහි රජයේ සේවය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතුය.

(4) තමාගේ ම මනාපය අනුව හෝ අධිකාරියේ ඉල්ලීම ප්‍රකාර හෝ වරායවල් පිළිබඳ අධිකාරියේ තාවකාලික සේවා නියුක්තිය අවසාන කරනු ලැබූ (2) වන උපවගන්තියෙහි සඳහන් සෑම රජයේ නිලධරයකු ම ඒ සේවා නියුක්තිය අවසාන කරන ලද දිනයෙහි සිට රජයේ සේවය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතුය.

ඒකාබද්ධ සේවයකට අයත් නොවන කොළඹ වරාය කොමිෂන් සභාවේ නිලධරයන් වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථිර සේවයේ නියුක්තවීම.

16. (1) 15 (2) වන වගන්තියේ සඳහන් සෑම රජයේ නිලධරයකුට ම වරායවල් පිළිබඳ අධිකාරියේ ඔහුගේ තාවකාලික සේවා නියුක්තියේ කාලය තුළ දී, අධිකාරියේ ස්ථිර සේවා නියුක්තිය පිරිනැමිය යුතුය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ 15 (2) වන වගන්තියේ සඳහන් සෑම රජයේ නිලධරයකු ම අධිකාරියේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිරව පත්කරනු ලැබූ දිනයෙහි සිට රජයේ සේවය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතුය.

(3) 1957 අංක 40 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 26 (4) සහ (5) වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව (2) වන උපවගන්තියෙහි සඳහන් රජයේ නිලධරයන්ට හා ඔවුන් සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(4) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් රජයේ නිලධරයෙක් 15 (1) වන වගන්තිය යටතේ, වරායවල් පිළිබඳ අධිකාරියේ තම තාවකාලික සේවා නියුක්තිය අවසාන වන දිනයෙහි හෝ ඊට පෙර. අධිකාරියේ ස්ථිර සේවා නියුක්තිය තමාට පිරිනමනු ලැබූ අවස්ථාවේදී එය නොපිළිගතහොත්, අධිකාරියේ ඔහුගේ තාවකාලික සේවා නියුක්තිය අවසාන කරනු ලැබිය යුතු අතර ඒ තාවකාලික සේවා නියුක්තිය අවසාන කරනු ලැබූ දිනයෙහි ඔහු රජයේ සේවය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතුය.

කොළඹ වරාය කොමිෂන් සභාවේ නිලධරයන්ට විශ්‍රාම යෑමේ ප්‍රදාන.

17. 15 (3), 15 (4), 16 (2) සහ 16 (4) වන වගන්තිවල සඳහන් වූ ද එම වගන්තිවල විධිවිධාන යටතේ විශ්‍රාම යන්නාවූ හෝ රජයේ සේවය අත්හැර ගිය ලෙස සලකනු ලබන්නා වූ සෑම රජයේ නිලධරයකුට ම—

(අ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි, කොළඹ වරාය කොමිෂන් සභාවේ ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් බවට ප්‍රකාශිත තනතුරක් වූයේ නම්, තනතුර නැති කිරීමේ හේතුව පිට ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම යවන ලද්දේ නම් ඔහුට දෙනු ලැබිය හැකිව තිබුණු අන්දමේ ප්‍රදානයක් ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට දෙනු ලැබිය යුතුය; නැතහොත්

(ආ) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ දායකයකුව සිටියේ නම්, සේවයෙන් පහකිරීමෙන් නොව අන් ලෙසකින්, ආණ්ඩුව සමග වූ ගිවිසුම ආණ්ඩුවේ කැමැත්ත ඇතිව අවසාන කිරීමෙන් ඔහු සේවය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ හේතුව පිට එම ආඥාපනත යටතේ ඔහුට ප්‍රදානයක් කරනු ලැබිය හැකිය.

වරාය (නැව්බඩු) සංස්ථාවේ හා වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ නිලධරයන් හා සේවකයන්.

18. (1) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ සේවයෙහි සිටි ඒ සංස්ථාවල සියලු නිලධරයන් හා සේවකයන් නියමිත දිනයෙහි වරායවල් පිළිබඳ අධිකාරියේ සේවයට මාරු කරනු ලැබූ ලෙස ද, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඔවුන්ට අදාළ වූ නියමයන් හා කොන්දේසි මත ම ඒ නියමිත දින සිට ඒ අධිකාරියේ නිලධරයන් හා සේවකයන් වන ලෙසද සලකනු ලැබිය යුතු ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලබන සෑම නිලධරයකුම හෝ සේවකයකුම නියමිත දිනයේදී, අවස්ථාවෝචිත පරිදි, වරාය (නැව්බඩු) සංස්ථාවේ නැතහොත් වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ සේවය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතුය. තව ද, වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, නියමිත දින සිට, එවැනි එක් එක් නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදලට සේවායෝජකයාගේ දායක මුදල හා සම්බන්ධයෙන් වූ වගකීම පවරාගනු ලැබිය යුතු ය.

15 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයන් නොවන රජයේ නිලධරයන් පත් කිරීම.

19. (1) වරායවල් පිළිබඳ අධිකාරියේ ඉල්ලීම පිට 15 වන වගන්තියේ සඳහන් රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ ද ඒ නිලධරයා සේවානියුක්ත කරවනු ලැබ සිටියේ යම් අමාත්‍යාංශයක් විසින් ද නැතහොත් යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද රාජ්‍ය පරිපාලනය පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව වරායවල් පිළිබඳ අධිකාරිය විසින් එවැනි ම කැමැත්ත ඇතිව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය. නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් රජයේ නිලධරයකු ඒ උපවගන්තිය යටතේ වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, 1978 අංක 10 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 (2) වන වගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් රජයේ නිලධරයකු ඒ උපවගන්තිය යටතේ වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 (3) වන වගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

පළාත් පාලන සේවයෙහි හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයන් සහ සේවකයන් වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

20. (1) වරායවල් පිළිබඳ අධිකාරියේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක හෝ යම් නිලධරයකු හෝ සේවකයකු (ඔහු පළාත් පාලන සේවයේ සාමාජිකයකු වුව ද නොවුව ද) ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ ද කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් එවැනිම වූ කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් සඳහා, අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ද පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය විසින් හෝ පළාත් පාලන ආයතනය විසින් ද එකඟත්වයට එළඹිය හැකි, විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් සම්බන්ධයෙන් නියම හා කොන්දේසි ඇතුළු, නියම හා කොන්දේසි මත, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ ද කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබීම හෝ කළ හැකි ය.

(2) (ඔහු පළාත් පාලන සේවයේ සාමාජිකයකු වුව ද නොවුව ද) පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු (1) වන උපවගන්තිය යටතේ වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත්වන විනය පාලනයට ම ඔහු ද යටත්විය යුතු ය.

ඇතැම් සේවා නියුක්තයන්ගේ සේවා කොන්දේසි වරායවල් පිළිබඳ අධිකාරිය විසින් වෙනස් කළ හැකි බව.

21. (1) 15 (1) වන හෝ 16 (1) වන වගන්තියේ විධිවිධාන යටතේ තැනැත්තන්ට තාවකාලික හෝ ස්ථිර සේවා නියුක්තිය පිරිනමනු ලබන විට වරායවල් පිළිබඳ අධිකාරිය විසින් වැටුපෙහි හා දීමනාවල සීරුමාරු කිරීම් කළ හැකිය. එසේ කිරීමේ දී, නියම හා කොන්දේසි, සමස්තයක් වශයෙන් ගත් කළ, ඒවා ඒ තැනැත්තන් නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි කොළඹ වරාය කොමිෂන් සභාවේ සේවයේදී භුක්ති විඳි නියමවලට හා කොන්දේසිවලට වඩා වාසි සහගත තත්ත්වයෙන් අඩු ඒවා නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත්කරන ලද, නියම වලින් හා කොන්දේසිවලින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, ඒ නියම හා කොන්දේසි තමා වෙත වරායවල් පිළිබඳ අධිකාරිය විසින් දැනුම් දෙනු ලැබූ දිනයෙහි සිට ගණන් බැලිය යුතු දින තිහක කාලයක් ඇතුළත අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනා කළ හැකිය. ඒ අභියාචනය පිළිබඳව ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරියට කරනු ලබන සේවය, ආණ්ඩුවට සේවය කිරීමේ ගිවිසුම්වල කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සැලකිය යුතු බව.

22. යම් නිශ්චිතව සඳහන් කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟවෙමින් යම් තැනැත්තකු ආණ්ඩුව සමඟ ගිවිසුමකට ඇතුළත් ව ඇති අවස්ථාවක, ඒ තැනැත්තා විසින් වරායවල් පිළිබඳ අධිකාරියට යම් කාලයක් සඳහා කරනු ලබන සේවයක් ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## III වන කොටස

### වරායවල් පිළිබඳ අධිකාරියේ දේපළ

23. (1) කොළඹ වරාය කොමිෂන් සභාවේ, වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැපයුම් සහ ආරක්ෂක සේවා සංස්ථාවේ නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි පවතින්නාවූ සියලු වත්කම්, බලතල, අයිතිවාසිකම්, සම්බන්ධතා සහ වරප්‍රසාද ඇතුළුව කොළඹ වරාය කොමිෂන් සභාව විසින් දරනු ලබන්නාවූ (මුදල් ද ඇතුළුව) සියලු චංචල සහ නිශ්චල දේපළ ද වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැපයුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ (අරමුදල්වල මුදල් ද ඇතුළු) සියලු චංචල හා නිශ්චල දේපළ ද, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, වරායවල් පිළිබඳ අධිකාරියට පවරනු ලැබිය යුතු අතර, ඒවා වරායවල් පිළිබඳ අධිකාරිය සතු විය යුතු ය.

කොළඹ වරාය කොමිෂන් සභාව විසින් දරන් නාවූ හා වරාය (නැව්බඩු) සංස්ථාවේ සහ වරාය සැපයුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ දේපළ වරායවල් පිළිබඳ අධිකාරියට පැවරීම.

(2) එසේ පවරනු ලැබූවිට, කොළඹ වරාය කොමිෂන් සභාවේ, වරාය (නැව්බඩු) සංස්ථාවේ හා වරාය සැපයුම් හා ආරක්ෂක සේවා සංස්ථාවේ (1) වන උපවගන්තියෙහි සඳහන් දේපළ සම්බන්ධයෙන්වූ හෝ දේපළට අදාළ වූ හෝ සියලු ණය, බැරකම් හා බැඳීම් ද, වරායවල් පිළිබඳ අධිකාරියට පවරනු ලැබිය යුතු අතර, ඒවා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් දරන ලද ලෙස ද, සලකනු ලැබිය යුතු ය.

24. (1) වරායවල් පිළිබඳ අධිකාරියේ කටයුතු සඳහා, ජනරජයේ යම් ඉඩමක් ඒ අධිකාරියට අවශ්‍යව ඇතැයි අමාත්‍යවරයා සලකන අවස්ථාවක රජයේ ඉඩම් ආඥාපනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇතද, අමාත්‍යවරයා විසින්, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන (මේ පනතෙහි මින් මතු "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින් ඒ නියමයෙහි සඳහන් කරනු ලැබිය යුතු දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි හා එසේ සඳහන් කරනු ලබන සීමා කිරීම් හෝ කොන්දේසි තිබේනම් ඒවාට යටත්ව ඒ ඉඩම අධිකාරිය සතු කළ හැකිය.

ජනරජයේ ඉඩම් වරායවල් පිළිබඳ අධිකාරිය සතු කිරීමට අමාත්‍යවරයා සතු බලය.

(2) සතු කිරීමේ නියමයක එහි සඳහන් යම් ඉඩමක් පිළිබඳ පරම අයිතිය, සියළු බැඳීම්වලින් තොරව, ඒ නියමයෙහි සඳහන් කරනු ලබන සීමා කිරීම් හා කොන්දේසිවලට යටත්ව, වරායවල් පිළිබඳ අධිකාරියට ලබාදීමේ බලපෑම තිබිය යුතු ය.

25. (1) වරායවල් පිළිබඳ අධිකාරියේ කටයුතු සඳහා, ජනරජයේ දේපළක් නොවන යම් නිශ්චල දේපළක් අවශ්‍යවී ඇත්තාවූ ද, එකඟවීමකින් ඒ දේපළ මිලට ගැනීමට අධිකාරියට නොහැකිවන්නාවූ ද අවස්ථාවක ඒ දේපළ අත්කරගැනීම ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන නියමයකින් අමාත්‍යවරයා අනුමත කළහොත්, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍ය දේපළක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඉඩම් අත්කරගැනීමේ පනත යටතේ එය අත්කරගැනීම ද, ඒ පනත යටතේ අධිකාරියට එය පවරනු ලැබීම ද කළ හැකිය.

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ වරායවල් පිළිබඳ අධිකාරිය සඳහා පුද්ගලික ඉඩම් අත්කර ගැනීම.

(2) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සඳහා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ගෙවිය යුතු වන යම් මුදලක් අධිකාරිය විසින් ගෙවනු ලැබිය යුතුය.

වරායවල් පිළිබඳ අධිකාරිය විසින් දරනු ලබන ඉඩම්වල පදිංචිකරුවන් නෙරපීම ආදිය පිළිබඳ කාර්ය පටිපාටිය.

26. (1) 24 වන සහ 25 වන වගන්ති යටතේ යම් ඉඩමක් වරායවල් පිළිබඳ අධිකාරිය සතු කරනු ලැබූ හෝ එයට පවරනු ලැබූ අවස්ථාවක එම නියමයෙහි සඳහන් කාලය ඇතුළත ඒ ඉඩම හැර යන ලෙස බලය නොලැබ ඒ ඉඩමෙහි සන්තකය දරන හෝ පදිංචිව සිටින කවර තැනැත්තකුට වුවද අධිකාරිය විසින් ලියවිල්ලකින් නියම කරනු ලැබිය හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් භාර දෙනු ලැබූ යම් තැනැත්තකු ඒ නියමයෙහි සඳහන් කාලය ඇතුළත ඒ නියමය අදාළ ඉඩම හැර යාම පැහැර හැරියහොත්, ඉඩමෙහි සන්තකය ලබාගැනීම සඳහා තත් කාර්ය සඳහා අධිකාරිය විසින් බලය දෙනු ලබන අධිකාරියේ යම් නිලධරයකු විසින් අධිකාරිය සඳහා සහ වෙනුවෙන් ඒ ඉඩමෙහි සන්තකය ලබාගනු ලැබිය හැකිය.

(3) වරායවල් පිළිබඳ අධිකාරිය සඳහා සහ වෙනුවෙන් යම් ඉඩමක සන්තකය ලබාගැනීමට (2) වන උපවගන්තිය යටතේ බලය දෙනු ලැබූ නිලධරයකුට කරනු ලැබ ඇති හෝ කරනු ලැබීමට ඉඩ ඇති යම් බාධා කිරීමක් හෝ ප්‍රතිරෝධයක් නිසා, ඒ ඉඩමෙහි සන්තකය ලබා ගැනීමට නොහැකිවේ නම් හෝ තමාට නොහැකි වේයයි ඔහු සැක කරන්නේ නම්, ඒ ඉඩම පිහිටියා වූ ස්ථානය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත් අධිකරණය වෙත තත්කාර්යය සඳහා ඔහු විසින් ඉල්ලීමක් කරනු ලැබූවිට, වරායවල් පිළිබඳ අධිකාරිය සඳහා සහ වෙනුවෙන් ඔහු වෙත ඒ ඉඩමේ සන්තකය භාරදෙන ලෙස පිස්කල්වරයාට විධාන කරන ඒ අධිකරණයේ ආඥාවක් ලැබීමට ඔහුට හිමිකම් තිබිය යුතු ය.

(4) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් පිස්කල්වරයා වෙත (3) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක ඔහු විසින් නොපමාව ඒ ආඥාව ක්‍රියාවෙහි යෙදවිය යුතු අතර, එය ක්‍රියාවෙහි යොදවන ලද ආකාරය ලියවිල්ලකින් අධිකරණයට වාර්තා කළ යුතු ය.

(5) මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා, ඒ ආඥාව අදාළ වන ඉඩමට, ගොඩනැගිල්ලට හෝ වෙනත් ඉදිකිරීමකට ඇතුළුවීම පිණිස ද, එහි පදිංචිවී සිටින යම් තැනැත්තකු නෙරපීම පිණිස ද, ඒ ඉඩමේ, ගොඩනැගිල්ලේ හෝ වෙනත් ඉදිකිරීමේ සන්තකය, වරායවල් පිළිබඳ අධිකාරිය සඳහා සහ වෙනුවෙන් එය භාර ගැනීමට බලයලත් තැනැත්තාට භාරදීම පිණිස ද අවශ්‍ය විය හැකි බලයක් පිස්කල්වරයා විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් හෝ පාවිච්චි කරනු ලැබිය හැකිය.

27. යම් නිශ්චිත වරායක සීමා තුළ ම පමණක් පාවිච්චි කරනු ලබන, වරායවල් පිළිබඳ අධිකාරියට අයත් යම් උපකරණ, බලපත්‍ර ගාස්තු හෝ බදු කිසිවකින් නිදහස් කිරීම සඳහා ප්‍රතිවිධාන, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, සැලැස්විය හැකිය. බදුවලින් නිදහස් කිරීම.

28. වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද, යම් නිශ්චිත වරායක සීමා තුළ නිවාස ගොඩනැගිලි නොවන, යම් කර්මාන්ත ශාලා හෝ ගොඩනැගිලි තැනීම සඳහා අධිකාරිය විසින් යම් පළාත් පාලන ආයතනයක අනුමතය ලබා ගැනීම අවශ්‍ය නොවිය යුතු ය. ඇතැම් ගොඩනැගිලි සඳහා පළාත් පාලක ආයතනයේ අනුමතය අනවශ්‍ය බව.

## IV වන කොටස

## මුදල්

29. (1) වරායවල් පිළිබඳ අධිකාරියට අධිකාරියේ ම අරමුදලක් තිබිය යුතුය. වරායවල් පිළිබඳ අධිකාරියේ සියළු ලැබීම් ඒ අරමුදලට ගෙවනු ලැබිය යුතු අතර, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් කරනු ලබන සියළු ගෙවීම් ඒ අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය. වරායවල් පිළිබඳ අධිකාරියේ අරමුදල.

(2) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් එහි විවිධ කටයුතු හා ව්‍යවසායන් වෙනුවෙන් වෙන වෙනම ගිණුම් තබා ගැනීම සම්බන්ධයෙන් කිසිදු ආකාරයක සීමා කිරීමක් (1) වන උපවගන්තියෙන් සිදු නොවිය යුතුය.

30. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් ව ඇතද— ඇතැම් මුදල් සහ වෙනත් වත්කම් වරායවල් පිළිබඳ අධිකාරියට පැවරීම සහ ආණ්ඩුව විසින් වරායවල් පිළිබඳ අධිකාරියට ප්‍රදානයක් කිරීම.

(අ) කොළඹ වරාය කොමිෂන් සභාවේ වියදම් සඳහා 1978 අංක 18 දරන විසර්ජන පනත යටතේ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද මුදලින් නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඒ කොමිෂන් සභාවේ බැරට පවතින ශේෂය ද;

(ආ) නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි, කොළඹ වරාය කොමිෂන් සභාව විසින් දරනු ලැබූ සියලු ගුදම්, මාර්ගස්ථ මඩු, තෙල් ස්ථාපන, වරාය දුම්රිය, නිවාස ගොඩනැගිලි, උපකරණ සහ චංචල දේපළ පිළිබඳව වරායවල් පිළිබඳ අධිකාරිය හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා අතර එකඟවන වටිනාකම; සහ

(ඇ) සම්මත කළ වියදමෙන් ආණ්ඩුව විසින් වරාය (නැව්බඩු) සංස්ථාවට සහ වරාය සැසදුම් හා ආරක්ෂක සේවා සංස්ථාවට දෙන ලද සියලු ණය පිළිබඳව, නියමිත දිනයට ඉහතින්ම වූ දිනයේ දී අය විය යුතු පොලී මුදල ද සමග, හිඟ ශේෂය

ආණ්ඩුව විසින් වරායවල් පිළිබඳ අධිකාරියේ කරන ලද කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධන ආයෝජනයක් ලෙස නියමිත දිනයෙහි සිට සලකනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන, වර්ෂයකට සියයට

අවක් නොඉක්මවන ලාභාංශයක් ඒ කොටස් හා ස්කන්ධ ප්‍රාග්ධනය වෙනුවෙන් අධිකාරිය විසින් ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු ය.

(2) අමාත්‍යවරයා විමසා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණයක්, එසේ නිශ්චය කරනු ලබන නියම මත පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින්, ඒකාබද්ධ අරමුදලින් වරායවල් පිළිබඳ අධිකාරියට කලින් කල ප්‍රදානය කරනු ලැබිය හැකිය.

වරායවල් පිළිබඳ අධිකාරියේ ස්කන්ධය.

31. (1) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ණය ලබා ගැනීමේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යම් ස්කන්ධයක් ඇති කිරීමත් නිකුත් කිරීමත් කරනු ලැබිය හැකි අතර, එසේ ඇති කොට නිකුත්කරනු ලබන ස්කන්ධය "වරායවල් පිළිබඳ අධිකාරියේ ස්කන්ධය" යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතුය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන නියමවලට අනුකූලව වරායවල් පිළිබඳ අධිකාරියේ ස්කන්ධය නිකුත්කිරීම, පැවරීම, ඒ සම්බන්ධයෙන් ක්‍රියාකිරීම, එය නිදහස් කිරීම සහ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

ආණ්ඩුවේ ඇප සහතිකය.

32. (1) 31 (1) වන වගන්තිය යටතේ ඇතිකොට නිකුත් කරනු ලබන යම් වරායවල් පිළිබඳ අධිකාරියේ ස්කන්ධයක හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් තැනැත්තකුගෙන්, සංවිධානයකින් හෝ ආයතනයකින් ලබාගනු ලබන වෙනත් යම් ණයක මුල් මුදල ආපසු ගෙවීම සහ ඒ වෙනුවෙන් වූ පොලිය ගෙවීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඇප සහතිකයක් දෙනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇප සහතිකයක් ඉෂ්ට කිරීම සඳහා, අවශ්‍ය යම් මුදලක්, පාර්ලිමේන්තුවේ පූර්ව අනුමතය ඇතිව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇප සහතිකයක් ඉෂ්ට කිරීමෙහි ලා ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබූ යම් මුදලක්, ඒ වෙනුවෙන්වූ පොලියත් සමග, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයක් අනුව, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් හා කාලයකින් ආපසු ගෙවිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් ඇප සහතිකයක් සැපයීමෙන් පසු වහාම මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් ඒ ඇප සහතිකය පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතුය; නැතහොත් එසේ තැබීමට සැලැස්විය යුතු ය.

(5) (2) වන උපවගන්තිය යටතේ සපයන ලද ඇප සහතිකයක් ඉෂ්ට කිරීමෙහි ලා ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නොපමාව ඒ ඇප සහතිකය පිළිබඳ ප්‍රකාශයක් පාර්ලිමේන්තුව හමුවේ තැබිය යුතු ය; නැතහොත් එසේ තැබීමට සැලැස්විය යුතු ය.

33. මේ පනතින් අන්‍යාකාරයකින් විශේෂයෙන්ම විධිවිධාන සලසනු ලැබ ඇත්තේ නම් මිස, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව වරායවල් පිළිබඳ අධිකාරියේ මුදල් පාලනයට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය. 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

34. ලිත් වර්ෂය වරායවල් පිළිබඳ අධිකාරියේ මුදල් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය.

35. වරායවල් පිළිබඳ අධිකාරිය විසින් එහි කාර්ය කිසිවක් සඳහා ආනයනය කරනු ලබන යම් යන්ත්‍රාගාර, යන්ත්‍රෝපකරණ හා වෙනත් උපකරණ වෙනුවෙන් වූ තීරු බද්ද අත්හැරීම ජාතික ආර්ථිකයේ යහපත සඳහා විය යුතු යයි ප්‍රධාන රේගු අයකැමි සෑහීමට පත් වන්නේ නම් වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ප්‍රධාන රේගු අයකැමි විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අනුඥාව ඇතිව ඒ තීරු බද්ද අත්හැර දැමිය හැකිය. තීරුබද්දෙන් නිදහස් කිරීම.

## V වන කොටස

### ගාස්තු හා ගාස්තු අයකර ගැනීම

36. නියමිත දිනයෙහි සිට, යම් නිශ්චිත වරායක සියලු වරාය සේවා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් පමණක් සපයනු ලැබිය යුතු ය. නැතහොත් විශේෂ අවස්ථාවල දී අමාත්‍යවරයාගේ විධානයක් පිට, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් බලය දෙනු ලබන යම් තැනැත්තකු විසින් පමණක් ඒ සේවා සපයනු ලැබිය යුතුය. නිශ්චිත වරායවල වරාය සේවා.

37. (1) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සපයනු ලබන සේවා සඳහා අධිකාරිය විසින් අය කරනු ලැබිය හැකි ගාස්තු තමාගේ අනුමතය දීමට පෙර මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසිය යුතු අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව අධිකාරිය විසින් නියම කරනු ලැබිය යුතු අතර අධිකාරිය විසින් එලෙසම ඒ ගාස්තු කලින් කල ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකිය. සේවා සඳහා ගාස්තු.

(2) ප්‍රධාන රේගු අයකැමි, වරාය කොමසාරිස්වරයා, යම් නිශ්චිත වරායක නැව්තොට සංවිධායකවරයා, වරාය (නැව්බඩු) සංස්ථාව සහ වරාය සැසඳුම් සහ ආරක්ෂක සේවා සංස්ථාව විසින් සපයනු ලබන සේවා සඳහා නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි අය කළ හැකිව තිබූ ගාස්තු, (1) වන උපවගන්තිය යටතේ ගාස්තු නියම කරනු ලබන තුරු, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සපයනු ලබන ඒ ඒ සේවාවන් සඳහා වූ ගාස්තු විය යුතුය.

(3) වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, ජාතික ආර්ථිකයේ සුභ සිද්ධිය පිණිස යෝජනා සම්මතයක් මගින් හා අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මේ වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු සියල්ලම හෝ ඒ ගාස්තුවලින් යම් කොටසක් හෝ අයකර ගැනී මෙන් වැළකී සිටිය හැකි ය.

ගිල ගාස්තු අයකර ගැනීම

38. (1) (අ) යම් බඩු වෙනුවෙන් ගාස්තු නොගෙවා තිබේ ද ඒ බඩු සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියට කැප අයිතියක් තිබිය යුතු අතර ගාස්තු සම්පූර්ණ යෙන් ම ගෙවනු ලබන තුරු ඒ බඩු තහනමට ගෙන රඳවා තබා ගැනීමට හිමිකම තිබිය යුතු ය. එසේ වුව ද ඒ හිමිකම ලැබෙනුයේ රේගු ආඥා පනත යටතේ තහනමට ගන්නා ලද හෝ රජය සන්තක කරන ලද හෝ එවැනි තහනමකට ගැනීමට නැතහොත් රජය සන්තක කිරීමට හෝ යටත් වන බඩු වශයෙන් ඒ බඩු සම්බන්ධ යෙන් ප්‍රධාන රේගු අයකැමිගේ හිමිකම් පෑමක් නැතහොත් පමණි ;

(ආ) වරායවල් පිළිබඳ අධිකාරියේ ගාස්තු නොගෙවීම සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් තහනම් කොට රඳවා ගන්නා ලද බඩු පිළිබඳව හිමිකම් පෑමක් ප්‍රධාන රේගු අයකැමිට තිබෙන අවස්ථාවක, එම බඩු මාර්ගස්ථ ගුදමෙහි ගොඩබා දින තිහක් ඇතුළත ඒ බඩු භාරගෙන බැහැර කිරීම හෝ රේගු ගුදමකට ඒ බඩු යැවීම හෝ ප්‍රධාන රේගු අයකැමි විසින් කරනු ලැබිය යුතු ය :

එසේ වුව ද තහනමට ගන්නා ලද නැතහොත් රජය සන්තක කරන ලද බඩු, ප්‍රධාන රේගු අය කැමි විසින් මේ ඡේදයේ ඉහත දැක්වෙන විධි විධාන යටතේ බැහැර කරනු ලබන අවස්ථාවක, වරායවල් පිළිබඳ අධිකාරියට ලැබිය යුතු සියලු ගාස්තු වරායවල් පිළිබඳ අධිකාරියට ඔහු විසින් ගෙවනු ලැබිය යුතු ය :

එසේ ම තවදුරටත් බඩු යථා පරිදි වූ පරීක්ෂණ යකින් පසුව තහනමට ගැනීමට නැතහොත් රජය සන්තක කිරීමට යටත් නොවන බඩු වශ යෙන් ඒ බඩු ලබන්නා වෙත නිකුත් කරනු ලබන

අවස්ථාවක, වරායවල් පිළිබඳ අධිකාරියට ලැබිය යුතු සියලු ගාස්තු බඩු ලබන්නා විසින් ගෙවා ඇති බවට තමාම සෑහීමට පත්වීමෙන් පසු, ප්‍රධාන රේගු අයකැමි විසින් ඒ බඩු, බඩු ලබන්නා වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) ආණ්ඩුවට ගෙවිය යුතු මුදල් සඳහා වූ හිමිකම් පෑම් හැර, වෙනත් සියලු හිමිකම් පෑම්වලට හා කැප අයිතිවලට ඉහළින්, (1) වන උපවගන්තියේ සඳහන් කැප අයිතියට ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(3) ගොඩබෑමට ඇති බඩු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ඒ බඩු ගොඩ බෑ වහාම ගෙවිය යුතුය.

(4) නැව්ගත කරනු ලැබීමට ඇති බඩු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ඒ බඩු නැව්ගත කරනු ලැබීමට පෙර ගෙවිය යුතුය.

(5) වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානයෙන් ඉවත් කරනු ලැබීමට ඇති බඩු වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු ඉල්ලූ විට ගෙවනු ලැබිය යුතුය.

39. (1) වරායවල් පිළිබඳ අධිකාරියේ යම් මාර්ගස්ථ මඩුවල තබන ලද බඩු කිසිවක්, ඒවා ඒ මඩුවල තබන ලද වේලාවේ සිට දින විසි එකක කාලයක් තුළ මඩුවලින් ඒවා ඉවත්කර නොගන්නා ලද අවස්ථාවක, ඒ වන තුරුත් ඒ මඩුවල තිබෙන ඒ බඩු සියල්ලම හෝ එකී බඩු අතුරින් යම් කිසිවක් හෝ ඒ කාලය ඉකුත් වූ විට, 40 වන වගන්තියේ විධිවිධානවලට හානියක් නොමැතිව, අධිකාරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබිය හැකිය: මාර්ගස්ථ මඩුවල ඇති බඩු විකිණීමේ බලය.

එසේ වුවද—

(අ) පූර්ණ නෞභාර පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති බඩු කිසිවක් සම්බන්ධයෙන් වූ විට, මේ උපවගන්තියෙහි සඳහන් දින විසි එකේ කාලය වෙනුවට වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන කාලයක් ආදේශ කරනු ලැබිය යුතු අතර, එය දින හතළිස් දෙකකට අඩු නො විය යුතු ය ;

(ආ) බඩු කිසිවක් විකිණීමක් හෝ බැහැර කිරීමක් සඳහා ද ඒ විකිණීම හෝ බැහැර කිරීම පිණිස ඒ බඩු තක්සේරුව සඳහා ද ප්‍රධාන රේගු අයකැමිගේ එකඟත්වය ඒ විකිණීම හෝ බැහැර කිරීම සඳහා ලබා ගන්නා තෙක් ද බඩු විකිණීමේ හෝ බැහැර කිරීමේ දිනය ප්‍රධාන රේගු අයකැමි වෙත ලියවිල්ලකින් දැනුම් දෙනු ලබන තෙක් ද ඒ බඩු විකිණීම හෝ බැහැර කිරීම මේ වගන්තියේ විධිවිධාන යටතේ නොකළ යුතු ය ;

(ඇ) (ආ) ඡේදයෙහි කුමක් සඳහන්ව ඇතද බඩු නරක් වන සුළු ස්වභාවයේ, උපද්‍රවදායක ස්වභාවයේ හෝ අප්‍රසන්න ස්වභාවයේ බඩු වේ නම්, අධිකාරිය සුදුසුයයි අදහස් කරන (ගොඩබෑමෙන් පසු පැය විසි හතරකට අඩු නොවන) වඩා කෙටි කාලයක් තුළ ඒවා ඉවත්කර ගන්නා ලෙස අධි

කාරිය විසින් විධාන කරනු ලැබිය හැකි අතර, එකී විකිණීමේ බලය ඒ කාලය ඉකුත් වූ විට ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය; තවද

(ඇ) ඒ විකිණීමේ දී යම් ලන්සුවක් නොතබනු ලැබිණි නම්, ප්‍රධාන රේගු අයකැමිගේ එකඟත්වය හෝ කැමැත්ත ඇතිව, අධිකාරිය විසින් කවර වූ හෝ ආකාරයකින් ඒ බඩු බැහැර කරනු ලැබිය හැකිය.

(2) අවසර පතක් ඉදිරිපත් කරනු ලැබූ විට හැර මහජනයා ඇතුළු කරගනු නොලබන ස්ථානයක හෝ ප්‍රදේශයක විකිණීමක් සිදු කිරීමේ හේතුව නිසාම පමණක්, (1) වන උපවගන්තියෙහි කාර්ය සඳහා ඒ විකිණීම අවලංගු නොවිය යුතු ය.

(3) වරායවල් පිළිබඳ අධිකාරියේ මතය අනුව යම් බඩු වහාම විකිණීම අවශ්‍ය වන හෝ නුවණට හුරු වන තරමට එම බඩු නරක් වන සුළු, උපද්‍රව සහගත හෝ අප්‍රසන්න ස්වභාවයකින් යුක්ත නම් මිස ඒ විකිණීමට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රචාරය වන සිංහල පුවත්පතක, දෙමළ පුවත්පතක සහ ඉංග්‍රීසි පුවත්පතක දැන්වීමක් පළ කිරීමෙන් ඒ විකිණීම පිළිබඳව දින තුනකට නොඅඩු දැන්වීමක් අධිකාරිය විසින් කළ යුතුය. තව ද, වරායවල් පිළිබඳ අධිකාරියේ මතය අනුව ඒ බඩු වහාම විකිණීම අවශ්‍ය වන හෝ නුවණට හුරු වන අවස්ථාවක අවශ්‍යතාවයේ හදිසිතාවය අනුව ඒ දැන්වීම කරනු ලැබිය යුතු ය.

(4) බඩුවල අයිතිකරුවන්ගේ ද බඩු බාන යාත්‍රාවේ අනුයෝජිතයාගේ ද, ලිපින ලිඛිත නැව්බඩු ලේඛනයෙන් හෝ වරායවල් පිළිබඳ අධිකාරියට ලැබී ඇති වෙනත් යම් ලේඛනයකින් හෝ දැනගත හැකි නම් නැතහොත් වෙනත් ආකාරයකින් දැනගනු ලැබේ නම් ඔවුන්ගේ ඒ ලිපිනවලට භාරදිය යුතු නැතහොත් ඒ ලිපිනවලට ලියාපදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු ලිපියක් මඟින් දැන්වීම ඔවුන්ට ද දිය යුතුය. විකුණනු ලැබීමට ඇති බඩුවල විස්තරය ද එම බඩු තිබෙන ස්ථානය ද ඒ දැන්වීමෙහි සඳහන් කළ යුතු ය.

(5) (4) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන්ව ඇතද, එකී දැන්වීම යැවීම නොකර හැරීම හේතුකොට ගෙන අව්‍යාජ ගැනුම්කරුවකුගේ අයිතිය අවලංගු නොවිය යුතු අතර ඒ දැන්වීම යවා තිබේදැයි ඒ ගැනුම්කරු විසින් සොයා බැලීම අවශ්‍ය නොවිය යුතුය.

(6) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බඩු විකිණීමෙන් ලත් මුදල පහත දැක්වෙන ගෙවීම් සඳහා පහත දැක්වෙන අනුපිළිවෙල අනුව වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යෙදිය යුතු ය:—

(අ) ඒ බඩු වෙනුවෙන් ආණ්ඩුවට ගෙවිය යුතු තීරු බද්ද;

(ආ) විකිණීමේ වියදම් ;

(ඇ) බඩු වෙනුවෙන් අධිකාරියට ලැබිය යුතු බදු, ගාස්තු හා වියදම් ගෙවීම ; සහ

(ඈ) වෙළෙඳ නැව් ගමනාගමනයට අදාළ නීතිය යටතේ දැන්වීම් කරනු ලැබූ නැව් කුලී හා වෙනත් හිමිකම්පෑම් හෝ කැප අයිතීන්.

(7) විකිණීමෙන් උපයාගත් මුදලින් (6) වන උපවගන්තිය යටතේ වූ ගෙවීම් කරනු ලැබීමෙන් පසු, යම් ශේෂයක් ඉතිරි වුව හොත් ඒ ශේෂය, ඒ බඩු, නරක් වන සුළු, උපද්‍රවසහගත හෝ අප්‍රසන්න බඩු නොවේ නම්, ඒ බඩුවලට හිමිකම් ඇති තැනැත්තා විසින් ඉල්ලූ විට ඔහුට හෝ, බඩු විකුණනු ලැබීමෙන් අවුරුද්දක් ඇතුළත එවැනි ඉල්ලීමක් නොකෙරිණි නම් නැතහොත් ඒ බඩු, නරක් වන සුළු, උපද්‍රවසහගත හෝ අප්‍රසන්න බඩු වේ නම්, පොදු ආදායමට හෝ ගෙවනු ලැබිය යුතු අතර, එසේ ගෙවනු ලැබූ විට, ඒ පිළිබඳ එකී තැනැත්තාගේ සියලු අයිතිවාසිකම් අහෝසි විය යුත්තේය.

40. (1) මේ පනත යටතේ ගෙවිය යුතු යම් ගාස්තු හෝ ඉන් කොටසක් ගෙවන ලෙස ඉල්ලූවිට වරායවල් පිළිබඳ අධිකාරියට එය ගෙවීම, යම් යාත්‍රාවක නෞකාධිපති, අයිතිකරු හෝ අනුයෝජිතයා විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ යාත්‍රාව සහ එයට අයත් මෙවලම් හෝ ආම්පන්න හෝ බඩුමුට්ටු හෝ වෙනත් භාණ්ඩ තහනම් කිරීම හෝ අත්අඩංගුවට ගැනීමද ගාස්තු ගෙවනු ලබන තුරු, ඒවා රඳවා ගැනීම ද, අධිකාරිය විසින් කරනු ලැබිය හැකිය : ගාස්තු ආදිය නොගෙවීම සම්බන්ධයෙන් තහනම් කිරීමේ බලය.

එසේ වුවද ඒ යාත්‍රාව තහනම් කිරීමක් හෝ අත් අඩංගුවට ගැනීමක් නිසා අනාප්තියට පත් යම් පාර්ශ්වයකට නීතියෙන් හිමිකම් ඇති සහන සඳහා වූ ඉල්ලීමක් නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් වෙත ඒ පාර්ශ්වය විසින් ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) ගාස්තු, ගිහ මුදල්, කුලී, අයවිය යුතු මුදල්, දණ්ඩන යන මේවායින් යම් කොටසක් හෝ යාත්‍රාව, මෙවලම්, ආම්පන්න හෝ බඩුමුට්ටු හෝ වෙනත් භාණ්ඩයක් තහනම් කිරීමේ, අත් අඩංගුවට ගැනීමේ හෝ රඳවා ගැනීමේ වියදම්වලින් යම් කොටසක් හෝ එවැනි යම් තහනම් කිරීමකින්, අත් අඩංගුවට ගැනීමකින් හෝ රඳවා ගැනීමකින් ඉක්බිතිවම වූ දින දහහතරේ කාලය තුළ නොගෙවන ලද අවස්ථාවක වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, එසේ තහනම් කරන ලද, අත් අඩංගුවට ගන්නා ලද හෝ රඳවා ගන්නා ලද යාත්‍රාව හෝ අනෙක් භාණ්ඩ විකුණනු ලැබීමට සැලැස්විය හැකි අතර එය විකිණීමෙන් ලබන මුදල, ගාස්තු හා (විකිණීමේ වියදම් ද ඇතුළු) වියදම් පියවීම සඳහා යොදනු ලැබිය හැකිය. ඉන් ශේෂයක් ඉතිරි වුවහොත් ඒ ශේෂය, ඉල්ලූවිටක යාත්‍රාවේ නෞකාධිපතිට, අයිතිකරුට හෝ අනුයෝජිතයාට අධිකාරිය විසින් ගෙවිය යුතු ය.

(3) යම් යාත්‍රාවකින් අයවිය යුතුව ඇති ගාස්තු වශයෙන් දැන්වීමෙහි නිශ්චිතව සඳහන් මුදල් ප්‍රමාණයක් අයවිය යුතුව ඇති බව සඳහන් කරමින් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ප්‍රධාන රේගු අයකැමි වෙත දැන්වීමක් නිකුත්කරනු ලැබූ අවස්ථාවක, එසේ අයවිය යුතු ඒ මුදල ගෙවනු ලබන තුරු ඒ යාත්‍රාවට යම් වරාය නිෂ්කාශණ අවසරයක් දීම ප්‍රධාන රේගු අයකැමි විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

(4) මේ වගන්තියෙහි විධිවිධාන, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වරායවල් පිළිබඳ අධිකාරිය සතු අයිතිවාසිකම් හීන කිරීමක් වශයෙන් නොව, ඒ අයිතිවාසිකම්වලට අතිරේක වශයෙන් විය යුතුය.

ගාස්තු සඳහා ඇප තැන්පත් කිරීම.

41. යම් ගාස්තු දරන්නා වූ හෝ දැරීමට අදහස් කර ගෙන සිටින්නා වූ හෝ තැනැත්තකුට, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඒ ගාස්තුවේ ප්‍රමාණය සැලකිල්ලට ගනු ලබන විට අධිකාරියේ මතය අනුව යුක්තිසහගත වන බව අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක්, එකී අන්දමින් යුක්තිසහගත වන ආකාරයකට, අධිකාරියෙහි තැන්පත් කරන ලෙස හෝ එවැනි මුදල් ප්‍රමාණයක් සඳහා ඇප සහතිකයක් දෙන ලෙස හෝ අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකිය. ඒ තැනැත්තා, එසේ නියම කරනු ලැබූ මුදල් ප්‍රමාණය තැන්පත් කිරීම හෝ ඒ මුදල් ප්‍රමාණය සඳහා ඇප තැබීම හෝ පැහැර හරින අවස්ථාවක, ඒ නියමයට අනුව ක්‍රියා කරන හෝ ඒ ගාස්තුව ගෙවනු ලබන තුරු, ගාස්තුව දරනු ලැබ තිබෙනුයේ හෝ දරනු ලබන්නේ නැව්තොටෙහි තිබෙන යම් යාත්‍රාවක් හෝ වරාය ස්ථානයෙහි තිබෙන යම් බඩු සම්බන්ධයෙන් ද වරායෙහි ඒ යාත්‍රාව හෝ වරාය භූමියෙහි බඩු හෝ අධිකාරිය විසින් රඳවා ගෙන තබාගනු ලැබිය හැකිය.

අසත්‍ය තොරතුරුදීම හා ගාස්තු ගෙවීම මගහැරීම.

42. (1) යම් වරාය සේවා සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය වෙත යම් වරාය පාවිච්චි කරන්නකු විසින් හෝ වෙනුවෙන් ඉදිරිපත් කරන ලද යම් ලේඛනයක යම් අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් ඇතුළත් වී තිබෙන සහ ඒ සේවා සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය යම් වියදමක් දරන අවස්ථාවක, නිසි විභාගයකින් පසුව හා මේ පනතේ වෙනත් යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇතද, එකී සේවය සඳහා කරනු ලබන සාමාන්‍ය ගාස්තුව මෙන් දෙගුණයක් නොඉක්මවන මුදලක් ඒ සේවය සඳහා ගෙවන ලෙස වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, අවස්ථාවෝචිත පරිදි, ප්‍රේෂණකරුට නැතහොත් ප්‍රේෂණලාභියාට නියම කිරීමද අදාළ බලධාරීන්ට එය දැනුම්දීම ද කරනු ලැබිය හැකිය. ඒ මුදල, වරායවල් පිළිබඳ අධිකාරිය වෙත අයවිය යුතු ගාස්තුවක් මෙන්, (2) වන උපවගන්තිය යටතේ, අයකර ගනු ලැබිය හැකිය.

(2) යම් බඩුවල අයිතිකරු විසින් හෝ යම් යාත්‍රාවක අයිතිකරු හෝ නෞකාධිපති විසින් හෝ වරායවල් පිළිබඳ අධිකාරියට ගෙවිය යුතු යම් ගාස්තු ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක ඒ අයිතිකරුගෙන් හෝ නෞකාධිපතිගෙන් ඒ ගාස්තු අයකරගැනීම සඳහා අධිකාරිය විසින් නඩු පවරනු ලැබිය හැකිය.

(3) වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද, ඒ ගාස්තු අයවිය යුතු වූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත යම් වේලාවක අධිකාරිය විසින් (2) වන උපවගන්තියෙහි සඳහන් තබු පැවරීම කරනු ලැබිය හැකිය.

වරායවල් පිළිබඳ අධිකාරිය හා ප්‍රධාන රේගු අයකැමි අතර කාර්ය සංවිධානය.

43. (1) නැව් බඩු පිළිබඳ රේගු නිෂ්කාශන ලේඛන ඉදිරිපත් කරන තුරු, ප්‍රේෂණලාභියාට හෝ ඔහුගේ අනුයෝජිතයාට නැව් බඩු කිසිවක් භාරදීම හෝ නැව්බඩු කිසිවක් නැව්ගත කිරීම හෝ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නොකළ යුතු ය.

(2) නිශ්චිත වරායවලදී ගාස්තු තක්සේරුකිරීම, එකතු කිරීම සහ අයකර ගැනීම සඳහා හෝ ඒ කාර්ය පහසු කිරීම සඳහා ද, ඒ නිශ්චිත වරායවල දී ශීඝ්‍රයෙන් යාත්‍රාවලට බඩු පැටවීම හා ඒවායින් බඩු බෑම සඳහා ද කටයුතු සලස්වනු පිණිස තමන් සුදුසු යයි සිතන යම් එකඟවීමකට හෝ කාර්ය සංවිධානයකට එළඹීමට වරායවල් පිළිබඳ අධිකාරියට සහ ප්‍රධාන රේගු අයකැමිට හැකිය.

යාත්‍රාවලට ඇතුළුවීම.

44. යම් නිශ්චිත වරායක සීමා තුළ හෝ ඒ වරායට ප්‍රවේශවන මාර්ගවල සීමා තුළ යාත්‍රාවක් පිළිබඳව හෝ සම්බන්ධයෙන් හෝ ඒ යාත්‍රාවෙහි ගෙන එනු ලබන හෝ ගෙන යනු ලබන බඩු සම්බන්ධයෙන් හෝ ගෙවිය යුතු ගාස්තු නිසැකව දැන ගැනීම පිණිස සහ ගාස්තු තක්සේරු කිරීම හා එකතු කර ගැනීමත් ඒ යාත්‍රාවට නැව් බඩු පැටවීම හා ඒ යාත්‍රාවෙන් නැව් බඩු බෑමත් සඳහා හෝ සම්බන්ධයෙන් හෝ අවශ්‍ය වන වෙනත් යම් තොරතුරු ලබා ගැනීම පිණිස හෝ ගින්නක් වළක්වාලීම හෝ නිවාදැමීම පිණිස හෝ, වරායවල් පිළිබඳ අධිකාරියේ නිලධරයකු විසින්, තමාගේ බලකඩදාසිය ඉදිරිපත් කරන ලෙස තමාට නියම කරනු ලැබුව හොත් එය ඉදිරිපත් කොට, එහි යම් යාත්‍රාවකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම කරනු ලැබිය හැකි ය.

## VI වන කොටස

### වරායවල් පිළිබඳ අධිකාරියේ වගකීම

පාඩුව, අලාභය හෝ හානිය සම්බන්ධයෙන් අධිකාරියේ වගකීම සීමා කිරීම.

45. යම් නිශ්චිත වරායක සීමා තුළ යම් දේපළකට හෝ තැනැත්තකුට සිදුවූ යම් පාඩුවක්, අලාභයක්, හෝ හානියක්, වරායවල් පිළිබඳ අධිකාරියේ හෝ ස්වකීය සේවානියුක්තියේ විෂය පථය තුළ ක්‍රියා කරන එහි යම් සේවා නියුක්තයකුගේ හෝ අනුයෝජිතයකුගේ නොසැලකිල්ලෙන් හෝ අයුතු හෝ නීති විරෝධී ක්‍රියාවකින් සිදු වූයේ නම් මිස, වරායවල් පිළිබඳ අධිකාරිය ඒ පාඩුව, අලාභය, හෝ හානිය සම්බන්ධයෙන් වගකීමට යටත් නොවිය යුතු ය.

තබන ලද හෝ තැන්පත් කරන ලද බඩු අයිතිකරුගේ ම වගකීම පිට විය යුතු බව.

46. වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සපයන ලද යම් තැන්පත් කිරීමේ ස්ථානයක තබන ලද හෝ තැන්පත් කරන ලද හෝ අධිකාරියට හෝ එහි අනුයෝජිතයන්ට අයිති යාත්‍රාවක හෝ වාහනයක ගෙන යනු ලබන හෝ සියලු බඩු, ඒ බඩුවල අයිතිකරුගේ ම, ආනයනකරුගේ ම, අපනයනකරුගේ ම, නැව්ගතකරන්නාගේ ම හෝ ප්‍රේෂණලාභියාගේ ම වගකීම පිට විය යුතු අතර වරායවල් පිළිබඳ අධිකාරියේ හෝ ස්වකීය සේවානියුක්තියේ

විෂය පථය තුළ ක්‍රියා කරන එහි යම් සේවා නියුක්තයකුගේ හෝ අනුයෝජිතයකුගේ නොසැලකිල්ලෙන් හෝ අයුතු හෝ නීති විරෝධී ක්‍රියාවකින් සිදු වූයේ නම් මිස, එකී බඩු කිසිවකට සිදුවන යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් අධිකාරිය වගකීමට යටත් නොවිය යුතු ය.

**උපරිම වගකීම.**

47. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ කුමක් සඳහන්ව ඇත ද, ඇසුරුමේ හෝ ඒකකයේ අන්තර්ගත බඩුවල ස්වභාවය හා වටිනාකම, එය වරායවල් පිළිබඳ අධිකාරියට භාර දෙනු ලැබීමට පෙර, එය භාර දෙන හෝ භාර දීමට සලස්වන තැනැත්තා විසින් ලියවිල්ලකින් ප්‍රකාශ කර ඇත්තේ නම් මිස, 46 වන වගන්තියෙහි සඳහන් යම් පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන්, ඇසුරුමක් හෝ ඒකකයක් වෙනුවෙන් රුපියල් පන්සියය ඉක්මවන මුදලක් ගෙවීමට වරායවල් පිළිබඳ අධිකාරිය වගකීමකට යටත් නොවිය යුතු ය:

එසේ වුව ද එවැනි බඩු කිසිවක වටිනාකම වරදවා ප්‍රකාශ කර තිබෙන අවස්ථාවක වරායවල් පිළිබඳ අධිකාරිය ඒ පිළිබඳව වගකීමකට යටත් නොවිය යුතු ය.

**වගකීම, එක් අවස්ථාවක් සම්බන්ධයෙන් සීමා කිරීම.**

48. මේ කොටස යටතේ වූ වගකීම් සීමාව, ඒ පාඩු හෝ අලාභ එක් තැනැත්තකුට වැඩි දෙනකු විසින් දරන ලද්දේ වුව ද, එක් ප්‍රභින්න අවස්ථාවක උද්ගත වන යම් පාඩුවල සහ අලාභ වල සමස්තය ම කෙරෙහි අදාළ විය යුතු අතර වගකීම උද්ගත වූයේ පොදු නීතිය අනුව වුව ද ලිඛිත නීතිය යටතේ වුවද, එසේ ම ඒ ලිඛිත නීතියෙහි කුමක් සඳහන් ව ඇත ද, ඒ සීමාව අදාළ විය යුතු ය.

**හිමිකම්පෑම් ඒකාබද්ධ කිරීමට අධිකරණවලට ඇති බලය.**

49. ජීවිත හානි හෝ පුද්ගලික හානි හෝ යාත්‍රා, දුම්රිය, වාහන හෝ වෙනත් කවර හෝ භාණ්ඩ නැතිවීම හා ඒවාට අලාභ සිදුවීම සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය යම් වගකීමක් දරනැයි කියනු ලබන්නාවූත් ඒ වගකීම සම්බන්ධයෙන් හිමිකම්පෑම් කීපයක් ඉදිරිපත් කර ඇත්තා වූ හෝ ඉදිරිපත් කෙරෙනු ඇතැයි අනුමාන කරන්නාවූත් අවස්ථාවක, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඒ සම්බන්ධයෙන් කොළඹ දිසා අධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ ඉල්ලීම විභාග කොට, නිශ්චය කිරීමට ඒ දිසා අධිකරණයට මෙයින් අධිකරණ බලය පවරනු ලබන අතර, ඒ දිසා අධිකරණය විසින් වරායවල් පිළිබඳ අධිකාරිය දරා ඇති වගකීම පිළිබඳ මුදල් ප්‍රමාණය නිශ්චය කිරීම ද, ඒ මුදල් ප්‍රමාණය විවිධ හිමිකම්පාන්නන් අතර ප්‍රමාණානුකූලව බෙදා දීම ද, ප්‍රස්තුත කාරණයම පිළිබඳව වෙනත් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා යම් නඩු කටයුත්තක් නැවැත්වීම ද, සම්බන්ධතා ඇති තැනැත්තන් නඩු කටයුත්තෙහි පාර්ශ්වකරුවන් කිරීම, නියමිත කාලයක් ඇතුළත නොපැමිණි හිමිකම්පාන්නන් බැහැර කිරීම, ඇප තබන ලෙස අධිකාරියට නියම කිරීම හා යම් ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් ඒ අධිකරණය සුදුසු යයි කල්පනා කරන ආකාරයකට හා විධානවලට යටත්ව ක්‍රියා කරගෙන යෑම ද කරනු ලැබිය හැකි ය.

**50.** (1) යම් නිශ්චිත වරායක් තුළ හෝ එහි ප්‍රවේශ මාර්ග තුළ හෝ මඩ ගොඩ දැමීම කරනු ලැබිය හැකි වන්නේ යම් සීමා ඇතුළත හා යම් මට්ටම් දක්වා ද, ඒ සීමා හා මට්ටම් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නිවේදනයක් මගින්, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව නියම කරනු ලැබිය හැකි ය.

නියමිත සීමා තුළ මඩ ගොඩ දැමීම වෙනුවෙන් පාඩු හෝ අලාභ සඳහා වරායවල් පිළිබඳ අධිකාරිය වගකීමට යටත් නොවන බව.

(2) එසේ නිශ්චිතව දක්වා ඇති සීමා තුළ හා මට්ටම් දක්වා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යම් මඩ ගොඩ දැමීමක් කරනු ලැබීම නිසා යම් මුහුදු හෝ ගංගා බැම්මකට, වාප්පුවකට, තටාකයකට හෝ වෙනත් දේපළකට සිදු වන කවර හෝ පාඩුවක් හෝ අලාභයක් සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය වගකීමකට යටත් නොවිය යුතු ය.

**51.** වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ගබඩා කිරීමට බඩු භාර ගනු ලැබීමෙන් ද එසේ ගබඩා කිරීමට භාර ගනු ලබන බඩුවලට සිදුවන යම් පාඩුවක්, විනාශයක් හෝ අලාභයක් සම්බන්ධයෙන් වගකීම භාර ගනු ලැබීමෙන් වැළැක්වීම මේ කොටසින් සිදු නොවිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී බඩු මෙන්ම පාඩුව, විනාශවීම හෝ අලාභය සඳහා වග කීමද වරායවල් පිළිබඳ අධිකාරිය විසින් භාරගත හැකි බව.

**52.** කම්කරුවන්ට වන්දි ගෙවීම සම්බන්ධයෙන් වූ යම් ලිඛිත නීතියකින් වරායවල් පිළිබඳ අධිකාරිය වෙත නියම කෙරෙන යම් වගකීමක් කෙරෙහි මෙම කොටසින් බල පෑමක් සිදු නොවිය යුතු ය.

කම්කරුවන්ට වන්දි ගෙවීමේ වගකීම.

**53.** මේ කොටසෙහි සඳහන් යම් පාඩුවක්, හානියක් හෝ අලාභයක් වෙනුවෙන්, යෝජනා සම්මතයක් මගින්, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යම් තැනැත්තකුට කරුණාසහගත ගෙවීමක් කරනු ලැබීම වැළැක්වීම මේ කොටසින් සිදු නොවිය යුතු ය.

කරුණා සහගත ගෙවීම.

**54.** මේ පනතට අනුකූලව කරනු ලැබ තිබෙන හෝ කරනු ලැබ ඇතැයි සලකනු ලබන යම් දෙයක් සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියට විරුද්ධව නඩුවක් පැවරීම—

(අ) ඒ සම්බන්ධව නඩුවක් පැවරීමට අදහස් කරනු ලැබ තිබෙන බව අධිකාරිය වෙත යටත් පිරිසෙයින් එක් මාසයකට වත් කලින් ලියවිල්ලකින් නොදන්වා ද ; නැතහොත්

(ආ) ඒ නඩු නිමිත්ත උද්ගත වූ දින සිට දොළොස් මාසයක් ඉකුත් වීමෙන් පසුව ද ;

කරනු නොලැබිය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරියට විරුද්ධව නඩු පැවරීම පිළිබඳ දැන්වීම.

## VII වන කොටස

### වැරදි, දණ්ඩන හා කාර්ය පටිපාටි

වරායවල් පිළිබඳ අධිකාරිය සතු කාර්ය කිරීමෙහි ලා එයට බාධා කිරීමට දණ්ඩනය.

55. යම් නිශ්චිත වරායක සීමා තුළ දී හෝ එහි ප්‍රවේශ මාර්ගවල සීමා තුළ දී—

(අ) මේ පනතින් බලය දෙන ලද යම් වැඩක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යම් මට්ටම් හෝ යම් උපදේශයක් දැක්වීමේ කාර්යය සඳහා පිහිටුවා ඇති යම් සලකුණු ඉවත් කරන ;

(ආ) හිතාමතාම හා නීත්‍යනුකූල හේතුවක් නොමැතිව යම් නැංගුරම්, බෝයා, ආලෝකධාරා ප්‍රදීප හෝ මුහුදේ හෝ ගොඩබිමේ සලකුණු ඉවත් කරන, ඒවාට හානි කරන හෝ ඉන් කිසිවකට යාත්‍රාවක් බඳින, ඒවා බුරුල් කරන හෝ පාකර හරින ;

(ඇ) ස්වකීය කාර්යය කිරීමේ දී වරායවල් පිළිබඳ අධිකාරියට හෝ එහි සේවානියුක්තයන්ගෙන්, අනුයෝජිතයන්ගෙන් හෝ කොන්ත්‍රාත්කරුවන්ගෙන් කිසිවකුට පහර දෙන, විරුද්ධකම් පාන, බාධා කරන හෝ අවහිර කරන නැත හොත් එසේ පහර දීමට, විරුද්ධකම් පෑමට, බාධා කිරීමට හෝ අවහිර කිරීමට වෙනත් යම් තැනැත්තකු පොළඹවන ;

(ඈ) විපතක් පිළිබඳ සංඥාවක් දීමේ කාර්යය සඳහා හෝ යම් ලිඛිත නීතියක් යටතේ අවසර දී ඇති වෙනත් කාර්යයක් සඳහා හෝ හැර, නීත්‍යනුකූල හේතුවක් නොමැතිව තුවක්කුවක් පත්තු කරන ;

(ඉ) යම් යාත්‍රාවකින් දුම් පිට කරවන, හෝ යම් යාත්‍රාවක් තුළ ගල්තාර, තාර, දුම්මල මැලියම්, ඩමාර්, ටර්පන්ටයින් තෙල් හෝ එවැනි වෙනත් ගිනිගන්නා ද්‍රව්‍යයක් උණුකරන හෝ රත්කරන හෝ ජලය යට යම් කටයුතු කිසිවක් කරන හෝ, වරායවල් පිළිබඳ අධිකාරියේ යම් නියමය කින් ඒ ක්‍රියාව කිරීම තහනම් කර තිබෙන යම් වේලාවක දී හෝ යම් සීමා තුළ දී නැතහොත් අධිකාරියේ නියමය කට හෝ විධානවලට පටහැනිව ඒ ක්‍රියා කරන ;

(ඊ) යම් යාත්‍රාවක ස්ප්‍රීතු වර්ග, ටර්පන්ටයින් තෙල්, හෝ ගිනි ගන්නා සුලු තෙල් වර්ග හෝ කවර වර්ගයක හෝ ද්‍රව වර්ග ඇදීමේ දී ආවරණය නොකළ පහනක් පාවිච්චි කරන ;

(උ) තෙල් හෝ වෙනත් යම් අපද්‍රව්‍යයක් හෝ ඉතිරවීමෙන් හෝ පිට කිරීමෙන් හෝ වරායේ ජලය අපවිත්‍ර කරන ; හෝ

(ඌ) වරායවල් පිළිබඳ අධිකාරියේ පූර්ව ලිඛිත අවසරය නොමැතිව යාත්‍රාවක් අකර්මණ්‍ය කරවන

යම් තැනැත්තකු වරදකට වරදකරුවන අතර මහේස්ත්‍රාත් වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු එකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

56. වරායවල් පිළිබඳ අධිකාරියට අයත් ලාම්පුවක එළිය නීති විරෝධී ලෙස නිවන තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත් වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. ලාම්පුවක් නිවීම සඳහා දණ්ඩනය.

57. (1) මේ පනත යටතේ අයකළ හැකි යම් මුදල්, බදු හෝ ගාස්තු යම් කවර ආකාරයේ වූ හෝ උපක්‍රමයකින් මගහරින හෝ මගහැරීමට තැත් කරන, යම් යාත්‍රාවක යම් නෞකාධිපතියකු, අයිතිකරුවකු හෝ අනුයෝජිතයකු හෝ යම් බඩුවල යම් අයිතිකරු වකු හෝ වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩය කට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාර ගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය. තවද එයට අතිරේකව, තමා විසින් ගෙවීම මග හරින ලද හෝ මග හැරීමට තැත් කළ මුදල්වල, බදුවල හෝ ගාස්තුවල ප්‍රමාණය මෙන් දෙගුණයක මුදලක් දණ්ඩන වශයෙන් වරායවල් පිළිබඳ අධිකාරියට ගෙවීමට ද ඔහු යටත් විය යුතු ය. අයවිය යුතු මුදල් බදු හා ගාස්තු ගෙවීම මගහැරීම.

(2) කලින් මගහරින ලද හෝ නොගෙවන ලද හෝ යම් මුදල්, කුලී හෝ ගාස්තු වරායවල් පිළිබඳ අධිකාරිය වෙත හෝ එහි යම් නිලධරයකු වෙත ඉදිරිපත් කිරීම නිසා හෝ වරායවල් පිළිබඳ අධිකාරිය හෝ එහි යම් නිලධරයකු විසින් භාර ගැනීම නිසා ඒ මග හැරීම හෝ නොගෙවීම හේතුකොට ගෙන සිදුවූ පාඩු කිසිවක් හෝ යම් දණ්ඩන මුදලක් ගෙවීමේ වගකීමෙන් ඒ තැනැත්තා මිදීම හෝ නිදහස් වීම සිදු නොවිය යුතු ය.

58. දැනුවත්ව ම කූට ලේඛන පාවිච්චි කරන හෝ මේ පනතෙහි විධිවිධාන මගින් හෝ ඒ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලැබීමට නියමිත හෝ බලය දෙන ලද යම් වාර වාර්තාවක, හිමිකම්පෑමක හෝ වෙනත් ලේඛනයක යම් වැදගත් විස්තරයක් පිළිබඳව යම් අසත්‍ය ප්‍රකාශයක් කරන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට හෝ හය මාසයක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය. අසත්‍ය වාර වාර්තා.

59. යම් තටාකයකට හෝ නැව් ලැඟුමකට ඇතුළු වන හෝ ඉන් පිටව යන හෝ ඇතුළුවීමට හෝ පිටව යෑමට අදහස් කරන, හෝ යම් වාෆ්පුවක අද්දරට පැමිණෙන හෝ යම් වාෆ්පුවකින් නික්ම යන යම් යාත්‍රාවක පෙවිය, දිග හෝ වැඩිම පළල පිළිබඳ අසත්‍ය තොරතුරු සපයන හෝ ඒ තොරතුරු නිසැකව දැන ගැනීම තමා සතු කාර්යය වන වරායවල් පිළිබඳ අධිකාරියේ යම් සේවා නියුක්තයකුට ඒ තොරතුරු සැපයීම ප්‍රතික්ෂේප කරන ඒ යාත්‍රාවේ යම් නෞකාධිපතියකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. යාත්‍රාවක පෙවිය ආදිය පිළිබඳ අසත්‍ය තොරතුරු දීම සඳහා දණ්ඩනය.

නැව්තොට තුළට පිරවුම් ද්‍රව්‍ය හෝ කසළ දැමීම සඳහා දණ්ඩනය.

60. නැව්තොටතුළට හෝ යම් නිශ්චිත වරායක් තුළට පිරවුම් ද්‍රව්‍ය, කසළ, දූවිලි, අළු, ගල් හෝ වෙනත් අපද්‍රව්‍ය හෝ දේවල් කිසිවක් විසි කරන හෝ හිස් කරන හෝ වරායවල් පිළිබඳ අධිකාරියේ කර්මාන්ත කිසිවකට හානිකර යම් ක්‍රියාවක් කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූවිට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

දේපළවලට අලාභ කිරීම.

61. (1) වරායවල් පිළිබඳ අධිකාරියට අයිති හෝ එයි භාරයේ හෝ පාලනය යටතේ පවතින යම් දේපළක් හිතාමතාම ඉවත් කරන, විනාශ කරන හෝ එයට අලාභ කරන හෝ ඒ දේපළ යම් ආකාරයකින් පාවිච්චි කිරීම සඳහා හෝ ක්‍රියාකරවීම සඳහා අදහස් කරන ලද්දේ ද ඒ ආකාරයෙන් එය පාවිච්චි කිරීමට හෝ ක්‍රියා කරවීමට අවහිර කරන හෝ එසේ කිරීම වළක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය. තව ද වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, වරදකරු විසින් කරන ලද යම් වරදක් සඳහා අධිකාරියට වන්දි ගෙවන ලෙස ද මහෙස්ත්‍රාත්වරයා විසින් ඔහුට අණවක් කරනු ලැබිය හැකිය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියට අයිති යම් දේපළක් නොසැලකිලිමත්කමින් හෝ අහම්බයකින් හෝ ඉවත් කරන, විනාශ කරන හෝ එයට අලාභ කරන හෝ ඒ දේපළ යම් ආකාරයකින් පාවිච්චි කිරීම සඳහා හෝ ක්‍රියාකරවීම සඳහා අදහස් කරන ලද්දේ ද ඒ ආකාරයෙන් එය පාවිච්චි කිරීමට හෝ ක්‍රියාකරවීමට අවහිර කරන හෝ එසේ කිරීම වළක්වන යම් තැනැත්තකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) ඒ තැනැත්තා විසින් සිදු කරන ලද අලාභය පිළිබඳ සම්පූර්ණ මුදල අයකර ගැනීම සඳහා, වරායවල් පිළිබඳ අධිකාරියට නීතියෙන් ඉඩ ලැබෙන යම් නීති කටයුතු, අධිකරණ බලය ඇති යම් අධිකරණයක දී අධිකාරිය විසින් පවරනු ලැබීම වැළැක්වීම මේ වගන්තියෙන් සිදු නොවිය යුතු ය.

පනතෙහි විධිවිධාන කඩ කිරීම වරදක් බව.

62. යම් තැනැත්තකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක හෝ රීතියක හෝ යම් විධිවිධානයක් කඩ කරන්නා වූ ද, ඒ විධිවිධානය කඩ කිරීම වෙනුවෙන් දඬුවමක් මේ පනතෙහි හෝ ඒ නියෝගයේ හෝ රීතියේ ප්‍රකාශිතව ම සලස්වා නොමැත්තා වූ ද අවස්ථාවක, ඒ තැනැත්තා ඒ විධිවිධාන කඩකිරීම සම්බන්ධයෙන් වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු අතර, එය නොකඩවා කරගෙන යනු ලබන යම් වරදක් වන අවස්ථාවක දී, ඔහු ඒ වරදට වරදකරු කරනු ලැබූ දිනයෙන් පසුව ඒ වරද නොකඩවාම කරගෙන යනු ලබන සෑම දිනයක් ම වෙනුවෙන් හෝ සෑම දිනයක කොටසක් වෙනුවෙන් රුපියල් පණහක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන වැරදි සඳහා එම මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්ගේ සහ ඇතැම් නිලධරයන්ගේ වගකීම.

**63.** පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරන ලද අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, වරද කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකුව, සාමාන්‍යාධිකාරීවරයාව, ලේකම්වරයාව හෝ වෙනත් එවැනි නිලධරයකුව සිටි සෑම තැනැත්තකු ම ; හෝ

(ආ) ඒ මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, වරද කරන ලද අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ සාමාජිකයකුව සිටි සෑම තැනැත්තකු ම

තමාගේ කැමැත්ත හෝ වංක සහයෝගය නොමැතිව ඒ වරද කර ඇති බවත්, තමා සතු කාර්යයේ ස්වභාවය ගැන සැලකිලිමත්ව හා සියලු අවස්ථානුගත තත්ත්වයන් යටතේ තමා විසින් යෙදිය යුතුව තුබුණු සියලු උද්යෝගය ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා විසින් යොදන ලද බවත්, ඔහු ඔප්පු කරනහොත් මිස, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

දඩ මුදල් අයකර ගත් විට ඒවා දඩ අරමුදලට ගෙවිය යුතු බව.

**64.** මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වූ යම් වරදක් වෙනුවෙන් නියම කරනු ලබන දඩ මුදල්, අයකර ගනු ලැබූ විට, යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, වරායවල් පිළිබඳ අධිකාරියේ දඩ අරමුදලට එම මුදල් ගෙවනු ලැබිය යුතු ය.

සභාපතිවරයා නඩු පැවරීම අනුමත කළ යුතු බව හා නඩු පවත්වාගෙන යනු ලබන්නේ කවුරුන් විසින් ද යන වග.

**65.** (1) වරායවල් පිළිබඳ අධිකාරියේ සභාපතිවරයාගේ හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිලධරයකුගේ හෝ ලිඛිත අනුමතය ඇතිව හැර, මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් කිසිම අධිකරණයක දී නඩු පැවරීමක් නොකරනු ලැබිය යුතු ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරිය වෙනුවෙන් නඩු පවත්වා ගෙන යාම සඳහා ඒ අධිකාරිය විසින් බලය දෙනු ලැබූ එහි යම් සේවා නියුක්තයකු විසින් අධිකාරිය වෙනුවෙන් නඩු පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

සිරභාරයට ගැනීමේ බලතල.

**66.** මේ පනත යටතේ වරදක් කරන යම් තැනැත්තකු හෝ තමා එවැනි යම් වරදකට වරදකරු බවට සාධාරණ සැකයකට ලක් වී ඇති යම් තැනැත්තකු, ගොඩබිමේ දී හෝ මුහුදේ දී, පොලිස් නිලධරයකු විසින් හෝ වරායවල් පිළිබඳ අධිකාරියේ ප්‍රදේශය ඇතුළත, වරායවල් පිළිබඳ අධිකාරියේ යථාපරිදි බලය ලත් ඒ අධිකාරියේ යම් සේවා නියුක්තයකු විසින් හෝ කිසිම වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබිය හැකි අතර එසේ සිරභාරයට ගනු ලැබූ සෑම තැනැත්තකු ම වහාම—

(අ) නීතිය අනුව කටයුතු කරනු ලැබීම සඳහා මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කළ යුතු ය ; නැතහොත්

(ආ) එසේ කිරීමට නොහැකි අවස්ථාවක, නීතිය අනුව කටයුතු කරනු ලැබීම පිණිස, ආසන්නතම පොලිස් ස්ථානය භාර නිලධරයාහට භාර කළ යුතු ය.

## VIII වන කොටස

### සාමාන්‍ය කරුණු

නියෝග.

67. (1) නියම කළයුතු බවට මේ පනතින් නියමිතව ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සාදනු ලැබීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද ඒ කාරණා සම්බන්ධයෙන් සහ, විශේෂයෙන් ම පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් හෝ සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) යාත්‍රා නවතා තැබීම පිණිස නැව් ලැගුම් සහ ස්ථාන වෙන් කර දීම, යම් නැව් ලැගුමකින්, ස්ථානයකින් හෝ නැංගුරම් පොළකින් යාත්‍රා ඉවත් කිරීම හා එසේ ඉවත් කිරීම කළ යුත්තේ යම් කාලයක් තුළ ද ඒ කාලය;

(ආ) යාත්‍රාවලට බඩු පැටවීම හා යාත්‍රාවලින් බඩු බෑම් කළ යුතු ආකාරය හා එය කළ යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි, සහ බඩු පටවනු ලබන හෝ බානු ලබන නැව් නවතා ඇති ස්ථාන වෙනස් කිරීම;

(ඇ) යම් නිශ්චිත වරායක සීමා තුළ සහ ඒ වරාය තුළ හෝ ඊට යාබදව වාප්පු, තටාක, නැංගුරම් සහ වෙනත් සමාන කර්මාන්ත ඔස්සේ හෝ ඒ අසළ හෝ අවශ්‍ය යයි සලකනු ලබන යම් පළලකින් යුත් අවහිරයෙන් තොර මාර්ග තැනීම සහ එසේ අවහිරයෙන් තොරව තැබිය යුතු ස්ථාන ලකුණු කොට වෙන් කිරීම;

(ඈ) සියලුම යාත්‍රා නැංගුරම් ලෑම, බැඳීම, නැංගුරම්වලට ඇදීම, නැංගුරම්වලින් ලිහීම, ඇඳුම් කඹ යෙදීම ද යාත්‍රාවල චාලක බලය, ඇඳුම් කඹ, නැංගුරම්, බෝයා, දම්වැල් සහ වෙනත් උපකරණ පාවිච්චිය; තවද පුද්ගලික නැංගුරම් හෝ බෝයා තැබීම හෝ තබා ගැනීම සඳහා වරායවල් පිළිබඳ අධිකාරිය සුදුසු යයි සලකන කොන්දේසි යටතේ අවසර දීම;

(ඉ) වෙරළේ, ජලයේ හා ගුවනේ වාහන ගමනාගමනය විධිමත් කිරීම, වාප්පුවල සහ නැව්තොට අවහිර වැළැක්වීම හා එම ස්ථානවල නිසි පිළිවෙල පවත්වා ගැනීම සහ වරාය ස්ථානයේ තිබෙන යම් නැව් බඩුවල, වරාය කර්මාන්ත සහ උපකරණවල ආරක්ෂාව ගැන වගබලා ගැනීම;

(ඊ) ගිනි සහ පහන් සහ විදුලි සැරසිලි පාවිච්චිය විධිමත් කිරීම සහ ගින්නක දී පාවිච්චි කළ යුතු සංඥා හෝ ගතයුතු ක්‍රියා මාර්ග විධිමත් කිරීම;

(උ) යම් නිශ්චිත වරායක හෝ එහි ප්‍රවේශ මාර්ගවල යාත්‍රාකරන යාත්‍රා විසින් යාත්‍රාකරණ ප්‍රදීප, සංඥා සහ සංඥා ආලෝක පාවිච්චිය ක්‍රියාවේ යෙදවීම හා විධිමත් කිරීම හා ඒ යාත්‍රා මගින් සට්ටන සිදුවීම වළක්වාලීම සඳහා ගතයුතු පියවර ක්‍රියාවේ යෙදවීම හා විධිමත් කිරීම;

(ඌ) යාත්‍රාවල නෞකාධිපතීන්, අයිතිකරුවන් හෝ යාත්‍රා භාර වෙනත් තැනැත්තන් විසින්, යාත්‍රා පැමිණීම සහ නික්මීම සම්බන්ධයෙන් ද වාප්පුවල දී හා වරායවල්

පිළිබඳ අධිකාරියේ ස්ථානයේ දී පටවනු ලබන හෝ බානු ලබන බඩු සම්බන්ධයෙන් ද සැපයිය යුතු තොරතුරු සහ ඒ තොරතුරු සැපයිය යුතු කාලය හා ආකාරය ;

(එ) යාත්‍රා විසින් නළා, සයිරන් නළා හා එවැනි වෙනත් සමාන උපකරණ පාවිච්චි කරනු ලැබීම විධිමත් කිරීම ;

(ඒ) නියම කරනු ලැබිය හැකි ස්ථානවල දී, වේලාවල දී සහ තැනැත්තන් විසින් හැර, යාත්‍රා නැවීම, සීරීම, මලකඩ පතුරු ගැලවීම, යාත්‍රා පිළිබඳ ශබ්ද නගන වැඩ හෝ දිය යට යාත්‍රා අළුත්වැඩියා කිරීම හෝ යාත්‍රා කොටස්වලට කැඩීම තහනම් කිරීම ;

(ඔ) වරායවල් පිළිබඳ අධිකාරිය සතු කර ඇති හෝ එහි පාලනය යටතේ පවතින ජැටි, තටාක හා ස්ථාන සහ අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන හෝ පාලනය කරනු ලබන යම් තොටුපල සේවා, ආරක්ෂා සහිතව හා පහසු ලෙස පාවිච්චි කිරීම ;

(ඕ) වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානය තුළ හා ඒ ස්ථාන යෙන් බඩු භාර නැවීම, ගබඩා කිරීම සහ ඉවත් කිරීම යන මේවාට අදාළ කාර්ය සංවිධාන හා කොන්දේසි, සහ ගොඩ බෑමට පෙර හානි සිදු වූ හෝ එසේ හානි සිදු වී යයි කියනු ලබන බඩු භාර ගැනීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය නියම කිරීම ;

(ක) යම් නිශ්චිත වරායවල් තුළ අන්තරායදායක බඩු පැටවීම, බෑම සහ ගබඩා කිරීම ; අන්තරායදායක බඩු වශයෙන් බඩු වර්ග කිරීම සහ අන්තරායදායක බඩු ගෙන එන යාත්‍රාවල යාත්‍රාකරණය හා ඒ යාත්‍රාවල ලැගුම් ස්ථාන විධිමත් කිරීම ;

(ග) යම් නිශ්චිත වරායක් තුළ අන්තරායදායක බඩු ගෙන එන යාත්‍රා තුළ අන්තරායදායක බඩු ඇසිරීමේ සහ තැබීමේ ක්‍රමය විධිමත් කිරීම ;

(ච) යම් නිශ්චිත වරායක් තුළ යම් අන්තරායදායක බඩු වර්ග යක් සමග වෙනත් යම් බඩු වර්ග හෝ ද්‍රව්‍ය හෝ යාත්‍රාවල පටවා ගෙන යෑම තහනම් කිරීම හෝ සීමා කිරීම ;

(ජ) යම් නිශ්චිත වරායක් තුළ හෝ ඒ වටා යාත්‍රාවලට හා යාත්‍රා වල සිට සහ ගබඩා ස්ථාන හා බන්කර අතර ඛනිජ තෙල්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ ලිහිස්සි තෙල් ගෙන යාමේ හා ගෙන ඒමේ ක්‍රියා ;

(ට) යම් නිශ්චිත වරායක ඉංජිනේරු වැඩ, සමීක්ෂණය කිරීම, නැව අවසිතා සැපැයීම, නැව් අලුත්වැඩියා කිරීම, නිෂ්කාශනය කිරීම සහ බඩු ප්‍රවාහණය කිරීම යන මේවා සහ වෙනත් එවැනි සේවා සලසන සංවිධානවලට හෝ පුද්ගලයන්ට බලපත්‍ර නිකුත් කිරීම සහ විධිමත් කිරීම ;

(ඩ) අර්ථසාධක අරමුදලක් කම්කරු විෂයය භාර අමාත්‍යවරයා ගේ එකඟත්වය ඇතිව ද, නෑගි අරමුදලක් හා දඩ අර මුදලක් ද පිහිටුවීම හා පරිපාලනය කිරීම ;

(ණ) වරායවල් පිළිබඳ අධිකාරියට අයිති හෝ එය විසින් පාවිච්චි කරනු ලබන හෝ එය විසින් පරිහරණය කරනු ලබන යම් දේපළක් සොරකම් කිරීම, රහසින් ගෙන යෑම, එයට අලාභ කිරීම හෝ එයට පීඩාවක් කිරීම වැළැක්වීම ;

(ත) යම් නිශ්චිත වරායක වරායවල් පිළිබඳ අධිකාරියේ සේවා නියුක්තයන්ගේ සහ වරාය පාවිච්චි කරන්නන්ගේ ආරක්ෂාව ;

(ද) වරායවල් පිළිබඳ අධිකාරියේ ස්ථානයට අලාභ සිදු කිරීම, එම ස්ථානය අපවිත්‍ර කිරීම සහ යම් නිශ්චිත වරායක නාවි තොට ජලය අපවිත්‍ර කිරීම වැළැක්වීම ;

(න) වරායවල් පිළිබඳ අධිකාරියේ නැව්බඩු, උපකරණ හා දේපළ ආරක්ෂා කිරීම සඳහා ද නිශ්චිත වරාය ස්ථාන තුළ නීතිය හා සාමය පවත්වාගෙන යෑමෙහි ලා සහායවීම සඳහා ද මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ද වරාය ආරක්ෂක සේවයක් පිහිටුවීම හා පවත්වාගෙන යෑම ;

(ප) සැසඳීම ද ඇතුළුව, නැව්බඩු පැටවීම, බෑම හා නැවකින් නැවකට මාරු කිරීම ;

(බ) නිශ්චිත වරායවලට තැනැත්තන්, වාහන සහ බඩු ඇතුළු කර ගැනීම විධිමත් කිරීම සහ ඒ වරායවල් තුළ එම තැනැත්තන්, හා වාහන එහා මෙහා යාම සහ ඒ බඩු ඔබ මොබ ගෙන යෑම විධිමත් කිරීම.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දින යෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක හෝ සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙන් පසු හැකි පහසු ඉක්ම ණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනු මතයේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඒ පරිච් ඡින්න කිරීමෙන් හානියක් නොවිය යුතුය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුත්තේ යම් දිනයක සිට ද ඒ දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය විසින් රීති සෑදිය හැකි බව.

68. (1) රීති සාදනු ලැබීමට මේ පනතින් බලය දෙන ලද හෝ නියමිත කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් සම්බන්ධ යෙන් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ අනුමතය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන තුරු, බල නොපැවැත්විය යුතු ය.

මේ පනත යටතේ හෝ වරායවල් පිළිබඳ අධිකාරියේ විධානය යටතේ හෝ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**69.** (අ) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වරායවල් පිළිබඳ අධිකාරියට විරුද්ධව ; හෝ

(ආ) අධිකාරියේ යම් සාමාජිකයකු, සේවා නියුක්තයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ අධිකාරියේ විධානය යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, සේවා නියුක්තයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

සිවිල් නඩුවක් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයකුගේ දේපළට හෝ ඒ තැනැත්තාට හෝ විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

**70.** වරායවල් පිළිබඳ අධිකාරියට විරුද්ධව පවරන ලද කිසිදු නඩුවක දී ඒ අධිකාරියේ සාමාජිකයකුගේ දේපළට හෝ ඒ තැනැත්තාට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය විසින් වරාය ආරක්ෂක සේවයක් ඇති කොට පවත්වාගෙන යා හැකි බව.

**71.** යම් නිශ්චිත වරායක සීමා තුළ, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් වරාය ආරක්ෂක සේවයක් පිහිටුවා, පවත්වාගෙන යනු ලැබිය හැකිය.

හිමිකම්පෑම් සමථයට පත් කිරීමට වරායවල් පිළිබඳ අධිකාරිය සතු බලය.

**72.** වරායවල් පිළිබඳ අධිකාරියට විරුද්ධව යම් තැනැත්තකු විසින් ඉදිරිපත් කරන ලද යම් හිමිකම්පෑමක් හෝ ඉල්ලීමක්, අධිකාරිය ප්‍රමාණවත් යයි සලකන යම් මුදල් ප්‍රමාණයක් හෝ වෙනත් වන්දි මුදලක් මත අධිකාරිය විසින් සමථයකට පත් කරනු ලැබිය හැකි ය.

බන්ධිත ගුදම.

**73.** (1) තත්කාලයෙහි වලංගුව පවත්නා යම් ලිඛිත නීතියක් යටතේ, වරායවල් පිළිබඳ අධිකාරියේ යම් ගුදමක් බන්ධිත ගුදමක් වශයෙන් අනුමත කොට නියම කර ඇති අවස්ථාවක, ඒ බන්ධිත ගුදමෙහි ගබඩා කර ඇති බඩු සම්බන්ධයෙන් ගෙවිය යුතු ආනයන තීරු බද්ද ගෙවීම සඳහා හෝ ඒ බඩු යථා පරිදි අපනයනය කිරීම සඳහා හෝ ඒ ලිඛිත නීතියෙන් නියම කරනු ලැබූ ඇපය අධිකාරිය විසින් තැබිය යුතු ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් එවැනි ඇපයක් තබන ලද අවස්ථාවක ඒ සඳහා, තවදුරටත් ඇපයක් තබන ලෙස ආණ්ඩුව විසින් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් නියම කරනු නොලැබිය යුතුය.

5—ඒ41923 (79/05)

(3) තත්කාලයෙහි වලංගුව පවතින යම් ලිඛිත නීතියක් යටතේ ආදායම් නිලධරයකු වන හෝ ආදායම් නිලධරයකුගේ බලතල ඇති යම් තැනැත්තකුට, තමාහ් සතු කාර්ය ඉටු කිරීම සඳහා, බන්ධිත ගුදමක් වශයෙන් අනුමත කොට, නියම කරන ලද ස්ථානයේ කොටස් ද ඇතුළුව, යම් නිශ්චිත වරායක සියලු කොටස්වලට ඇතුළු වීමට සියලු වේලාවන්හි දී අවසර දිය යුතු අතර ඒ සම්බන්ධයෙන් තබා ඇති පොත් හා එහි ඇති තොග පරීක්ෂා කිරීමට ද ඔහුට අවසර දිය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ ගිවිසුම්.

74. වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, සාදනු ලබන රීතිවලට අනුකූලව, ඒ අධිකාරියට ස්වකීය කටයුතු කිරීම සඳහා අවශ්‍යවන ගිවිසුම්වලට ඇතුළත් විය හැකි අතර, බඩු හෝ ද්‍රව්‍ය සැපයීම සඳහා හෝ වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා හෝ වූ ගිවිසුම් සම්බන්ධයෙන් වූ විට, ඒ රීතිවලින්—

(අ) හැකිතාක් දුරට හා ඒ රීතිවල අනාශ්‍යකාර විධිවිධාන ඇලස්වා ඇතහොත් හැර, ඒ ගිවිසුම්වලට ඇතුළත්වීමට අදහස් කරන බවට දැන්වීමක් පළ කළ යුතු යයි හා ටෙන්ඩර් කැඳවිය යුතු යයි නියම කළ යුතු ය ; තවද

(ආ) ඒ දැන්වීම පළ කළ යුතු හා ටෙන්ඩර් කැඳවිය යුතු ආකාරය නියම කළ යුතු ය :

එසේ වුව ද, ඒ රීති අනුව ක්‍රියා කරනු ලැබ තිබේදැයි විමසීමට, වරායවල් පිළිබඳ අධිකාරිය සමග ගිවිසුමකට ඇතුළත් වන තැනැත්තකු බැඳීමකට යටත් නොවිය යුතු අතර එවැනි සියලු ගිවිසුම්, වෙනත් කරුණු අතින් ඒවා වලංගු නම්, ඒවාට අදාළ රීති අනුව ක්‍රියා කරනු ලැබ නොමැති වුවත්, සම්පූර්ණයෙන් බලාත්මකව හා සම්පූර්ණ බලපෑමෙන් යුක්ත විය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරිය සමග ගිවිසුම්වලට ඇතුළත් වීමට සමාගම් ආදියට ඇති බලය.

75. වරායවල් පිළිබඳ අධිකාරිය සමග යම් සමාගමකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට, ඒ සමාගමේ හෝ මණ්ඩලයේ කටයුතු වලට අදාළ යම් ලිඛිත නීතියක හෝ සාධන පත්‍රයක පටහැනිව කුමක් සඳහන්ව ඇතත්, එම අධිකාරියේ කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ගිවිසුම්වලට ඇතුළත් වී, ඒවා ඉටුකල හැකි ය.

බලය ලද හොත් සේවා නියුක්තයකු විසින් ලදුපත් හා දැන්වීම දිය හැකි බව

76. (1) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් දෙනු ලැබීමට මේ පනතින් හෝ වෙනත් ලිඛිත නීතියකින් හෝ වරායවල් පිළිබඳ අධිකාරියට බලය පවරා ඇති සියලු දැන්වීම්, නියමයන්, ලදුපත් හා වෙනත් කවර හෝ ස්වභාවයක වූ වෙනත් ලේඛන, ඒවා දීම සඳහා අධිකාරිය විසින් බලය දෙන ලද අධිකාරියේ යම් සේවා නියුක්තයකු විසින් දෙනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් දැන්වීමක්, නියමයක්, ලදුපතක් හෝ ලේඛනයක් සඳහා තථ්‍යතා සහතිකයක් අවශ්‍යවන අවස්ථාවක, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් තත්කාර්යය සඳහා බලය දෙනු ලැබූ ඒ අධිකාරියේ යම් සේවා නියුක්තයකුගේ අත්සන හෝ එහි අනුරූපයක් එහි තබන ලද කල්හි එය ප්‍රමාණවත් තථ්‍යතා සහතිකයක් විය යුතු ය.

77. (1) යම් තැනැත්තකුට භාර දෙනු ලැබිය යුතු ලෙස මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් යටතේ හෝ නියමිත හෝ බලය දී ඇති යම් දැන්වීමක්, නියමයක් හෝ ලේඛනයක් භාර දීම— දැන්වීම් ආදිය භාරදීම.

(අ) එම තැනැත්තාට ගෙන ගොස් එය භාරදීමෙන් හෝ එම තැනැත්තාගේ සාමාන්‍ය හෝ අන්තිමට දැන සිටි වාසස්ථානයේ දී ඔහුගේ පවුලේ යම් වැඩිහිටි සාමාජිකයකුට හෝ මෙහෙකරුවකුට ගෙන ගොස් එය භාරදීමෙන් ;

(ආ) ඔහුගේ ලිපිනයට යොමු කළ කවරයක බහා, එය ඔහුගේ සාමාන්‍ය හෝ අන්තිමට දැන සිටි වාසස්ථානයේ හෝ ව්‍යාපාර ස්ථානයේ තබා ඒමෙන් ; නැතහොත්

(ඇ) ඔහුගේ සාමාන්‍ය හෝ අන්තිමට දැන සිටි වාසස්ථානයේ දී හෝ ව්‍යාපාර ස්ථානයේ දී ලැබීමට ඒ තැනැත්තාට යොමු කොට ලියාපදිංචි කළ තැපෑලෙන් එය යැවීමෙන්

කළ හැකිය.

(2) (1) වන උපවගන්තියෙහි විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද යාත්‍රාකරණයට යම් බාධාවක් හෝ අවහිරයක් කරන්නා වූ හා කවරෙක් දැයි නොදන්නා වූ යම් තැනැත්තකුට දෙනු ලැබීමට නියමිත යම් දැන්වීමක්, ඒ බාධාව හෝ අවහිරය කරනු ලබන ස්ථානය මත, ස්ථානයේ හෝ ස්ථානය අසල අලවන ලද නම්, එය යථා පරිදි භාර දෙනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

78. මේ පනතේ කාර්ය සඳහා පැවැත්වීමට නියම කරන ලද යම් සමීක්ෂණයක් හෝ පරීක්ෂණයක් පැවැත්වීමේ හෝ ක්‍රියාත්මක කිරීමට නියම කරන ලද යම් වැඩක් ක්‍රියාත්මක කිරීමේ හෝ කාර්යය සඳහා යම් ගොඩනැගිල්ලකට හෝ ඉඩමකට ඇතුළුවීමට වරායවල් පිළිබඳ අධිකාරියේ යම් සේවානියුක්තයකු, අනුයෝජිතයකු හෝ කොන්ත්‍රාත්කරුවකු වන යම් තැනැත්තකුට ඒ අධිකාරිය විසින් බලය දෙන ලද නම්, ප්‍රමාණවත් කාලයක දැනුම් දීමකින් පසු, දවසේ යුක්තිසහගත සියලුම කාලවේලාවල දී ඔහුට ඒ ගොඩනැගිල්ලට හෝ ඉඩමට ඇතුළුවිය හැකි ය. එසේ ඇතුළුවීම සම්බන්ධයෙන් හෝ මේ පනතට අනුකූලව ඔහුගේ කාර්ය ඉටු කිරීමෙහි ලා අවශ්‍ය වන ඒ ගොඩනැගිල්ලේ හෝ ඉඩමේ යම් කොටසක ඔහු විසින් සද්භාවයෙන් කරන ලද කිසිවක් සම්බන්ධයෙන් බැඳීමකට ඒ තැනැත්තා යටත් නොවිය යුතුය. ඉඩම්වලට ඇතුළුවීමට ඇති බලය.

79. (1) (අ) වරායවල් පිළිබඳ අධිකාරියේ අවසරය නොමැතිව— වරායවල් පිළිබඳ අධිකාරියේ අවසරය නොමැතිව වරාය ස්ථානයෙහි තබා යන ලද වාහන ඉවත් කිරීම.

(i) වරායවල් පිළිබඳ අධිකාරිය විසින් සපයා ඇති, වාහන නවත්වන ස්ථානයක විසිහතර පැය කට වැඩි කාලයක් සඳහා ;

(ii) අධිකාරිය විසින් සවි කරන ලද දැන්වීමකින් වාහන නවත්වා තැබීම තහනම් කර ඇති, වරාය ස්ථානයේ යම් කොටසක ; හෝ

(iii) වරාය ස්ථානය පාවිච්චි කිරීමට බාධා හෝ අවහිර ඇතිවීමට ඉඩ ඇති වන පරිදි යම් ස්ථානයක :

යම් වාහනයක් නවත්වා තබා ගොස් ඇතහොත්, වරාය වල් පිළිබඳ අධිකාරිය විසින් ඒ වාහනය ඉවත් කොට, ඒ වාහනයේ අයිතිකරුගේ ම වගකීම පිට අධිකාරියේ එළිමහන් අංගනයක එය තබනු ලැබිය හැකි ය ;

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදයේ (ii) වන අනු ඡේදයෙහි සඳහන් යම් දැන්වීමක් එය අදාළ වන ස්ථානයේ හෝ ඒ අසල පැහැදිලිව පෙනෙන ලෙස සවි කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියෙහි බලතල ක්‍රියාත්මක කරමින් වරායවල් පිළි බඳ අධිකාරිය වාහනයක් ඉවත් කරන හෝ වාහනයක් ඉවත් කිරී මට වෙනත් යම් තැනැත්තකුගේ සේවය යොදා ගන්නා අවස්ථාවක, වාහනය ඉවත් කිරීමේ හා එයට ආනුෂංගික වියදම්, යම් ගාස්තු හෝ දණ්ඩනයක් සමග, අධිකාරිය විසින් ඒ වාහනයේ අයිතිකරු ගෙන් නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක දී ණයක් අයකර ගන්නා ලෙස අය කර ගනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියෙහි බලතල ක්‍රියාත්මක කරමින් වරායවල් පිළිබඳ අධිකාරිය වාහනයක් ඉවත් කළහොත්, මෝටර් රථ වාහන පනතේ හෝ ඒ බලපෑම ම ඇති තත් කාලයෙහි වලංගුව පවතින වෙනත් නියෝග කිසිවක කාර්යය සඳහා, වාහනයේ අයිතිකරු වශයෙන් තත් කාලයෙහි ලියාපදිංචි කරනු ලැබ සිටින තැනැත්තා වෙත, ඔහුගේ අන්තිමට දැන සිටි ලිපිනයට, ඔහුගේ ලියාපදිංචි කළ ලිපිනයට හෝ වාහනය සාමාන්‍යයෙන් තබනු ලබන ස්ථානයේ ලිපිනයට, වරායවල් පිළිබඳ අධිකාරිය මේ වගන්තියෙන් ලැබී ඇති බලතල ක්‍රියාත්මක කර ඇති බවත් වාහනය සඳහා හිමිකම් පා (2) වන උපවගන්තියෙහි සඳහන් ගාස්තු හා දණ්ඩන මුදල් ගෙවා එය ඉවත් කරගෙන යා හැකි බවත් දන්වමින් අධිකාරිය විසින් දැන්වීමක් යැවීම යුක්තිසහගතව කළ හැකි නම් සහ එසේ යැවීමට යුක්ති සහගතව හැකි වූ වහාම අධිකාරිය විසින් එසේ දැන්වීමක් යවනු ලැබිය යුතු ය.

(4) එවැනි යම් වාහනයක් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඉවත් කරනු ලැබූ දිනයෙන් පසු දින දහහතරක් ඇතුළත (හෝ, ලියාපදිංචි කරන ලද වාහනයක් සම්බන්ධයෙන් වූ විට අයිතිකරු හෝ හිමිකරු වෙත දැන්වීමක් භාරදීමෙන් පසු දින දහහතරක් ඇතුළත) එහි අයිතිකරු විසින් හෝ ඔහු වෙනුවෙන් යම් කිසි තැනැත්තකු විසින් හෝ ඒ වාහනයට හිමිකම් පා, එය ඉවත් කර ගනු නොලැබිණි නම්, අධිකාරිය විසින් වෙන්දේසියේ හෝ ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවී මෙන් හෝ වාහනය විකුණනු ලැබීමට සැලැස්විය හැකි ය. එහෙත් ඒ වෙන්දේසිය හෝ ටෙන්ඩර් කැඳවීම පිළිබඳ දින හතකට නොඅඩු කාලයක දැන්වීමක් ශ්‍රී ලංකාවේ පළ කෙරෙන හා සංසරණය වන යටත් පිරිසෙයින් එක් සිංහල පුවත්පතක ද එක් දෙමළ පුවත් පතක ද එක් ඉංග්‍රීසි පුවත් පතක ද පළ කරනු ලැබිය යුතු ය. ඒ වෙන්දේසිය හෝ ටෙන්ඩර් කැඳවීම මගින් වාහනය නොවිකුණනු ලැබුවහොත් වරායවල් පිළිබඳ අධිකාරිය සුදුසු යයි කල්පනා කරන පරිදි එය විකිණීම හෝ විනාශ කිරීම හෝ බැහැර කිරීම හෝ අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියෙන දෙනු ලැබූ විකිණීමේ බලය අභිප්‍රේත පරිදි ක්‍රියාත්මක කිරීමේ දී යම් වාහනයක් විකුණන ලද අවස්ථාවක, ගැනුම්කරුගේ අයිතිය කවර හෝ හේතුවක් නිසා හෝ දෝෂාභියෝගයකට යටත් නොවිය යුතු අතර වෙනත් යම් තැනැත්තකුගේ කවර හෝ අයිතියකින්, හිමිකමකින්, සම්බන්ධතාවකින් හෝ අයිතිවාසිකමකින් තොර නිදහස්ව වාහනය ඔහුට හිමිවිය යුතු ය.

(6) එම විකිණීමේ ශුද්ධ ලාභයෙන් (3) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු යම් මුදලක් අඩු කිරීමෙන් පසු ඉතිරි වන මුදල, වරායවල් පිළිබඳ අධිකාරිය විසින්, පාර්ශ්වකරුවන්ට දැනුම් දී, තැන්පතුවක් වශයෙන් තබා ගෙන, එයට හිමිකම් ඇති තැනැත්තාට ගෙවිය යුතු ය.

එකී මුදලට හිමිකම් පාන්නන් එක් කෙනකුට වැඩි ගණනක් සිටියහොත්, විනිශ්චය සඳහා එම ආරාවුල අධිකරණය වෙත යොමු කළ යුතු ය.

එහෙත් එක් අවුරුද්දක් ඇතුළත එම මුදලට යම් තැනැත්තකු විසින් හිමිකම් පෑමක් නොකරන ලද්දේ නම් අධිකාරියේ අරමුදලට එය බැර කරනු ලැබිය යුතු ය.

(7) එසේ යම් මුදලක් ගෙවනු ලැබූ තැනැත්තා එයට හිමිකම් ඇති තැනැත්තා නොවන අවස්ථාවක, වරායවල් පිළිබඳ අධිකාරිය ඒ ගෙවීම සම්බන්ධයෙන් වගකීමට යටත් නොවිය යුතු අතර අධිකාරිය විසින් ඒ ගෙවීම කරනු ලැබූ තැනැත්තාට විරුද්ධව ඒ මුදලට හිමිකම් පාන යම් තැනැත්තකු විසින් ක්‍රියාකරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තියෙහි "වාහනය" යන්නට වාහනයට අනුයුක්ත, එහි ඇති හෝ ඊට සම්බන්ධ සියලු බඩු හා චංචල දේපළ ඇතුළත් වේ.

(9) මේ වගන්තියෙන් වරායවල් පිළිබඳ අධිකාරියට දෙන ලද බලතල හා අභිමතයන් ඒ සම්බන්ධයෙන් අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලබන එහි යම් නිලධරයකු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(10) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ සාමාන්‍ය බලපෑම සඳහන් වන දැන්වීමක් වරායවල් පිළිබඳ අධිකාරියේ ප්‍රධාන දැන්වීම් පුවරුව මත ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

නෞකාධිපති විසින් නැව්බඩු ලැයිස්තුවක් වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්යාලයෙහි තැබිය යුතු බව.

80. (1) සෑම ආනයන යාත්‍රාවක නෞකාධිපති හෝ අයිතිකරු හෝ ඔහුගේ අනුයෝජිතයා හෝ විසින්, ඒ යාත්‍රාවෙහි ආනයනය කරන ලද සියලු ම බඩු අවසාන වශයෙන් බෑමෙන් පසු ඊළඟ දින දහහතර ඇතුළත—

(අ) එක් එක් ඇසුරුම් මිටියේ දළ බර, මිනුම්, සලකුණු, අංක හා අන්තර්ගත දේ ; සහ

(ආ) නෞභාර පත්‍ර අනුව ප්‍රේෂණලාභීන්ගේ නම් හෝ ඒ බඩු සඳහා නියම වශයෙන්ම නැව් කුලී ගෙවන තැනැත්තන් ගේ නම්

පිළිබඳ සියලු විස්තරද ඇතුළත් එකී බඩුවල සම්පූර්ණ හා නිවැරදි ලැයිස්තුවක් ඔහු විසින් අත්සන් කොට වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු ය.

(2) ඒ ලැයිස්තුව අත්සන් කිරීම හා තැබීම පැහැර හරින එවැනි යම් නෞකාධිපතියකු, අයිතිකරුවකු හෝ අනුයෝජිතයකු ම වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(3) සෑම අපනයන යාත්‍රාවක ම අයිතිකරු, එය කුලියට ගන්නා තැනැත්තා, ප්‍රේෂණකරු, අනුයෝජිතයා හෝ එයට බඩු පැටවීමෙහි හෝ එය නිෂ්කාශණය කිරීමෙහි ලා ක්‍රියා කරන වෙනත් තැනැත්තකු හෝ විසින්, ඒ යාත්‍රාවෙහි අපනයනය කරනු ලබන සියලුම බඩු පිළිබඳ සම්පූර්ණ හා නිවැරදි ලැයිස්තුවක් නැතහොත් නැව්බඩු ලේඛනයක් එහි නෞභාර බිල්පත් සහ නැව් ගාස්තු ලැයිස්තු අනුසාරයෙන් පිළියෙල කළ යුතු අතර ඒ යාත්‍රාව වරායෙන් නික්ත්ව ගිය පසු දින දහ හතරක් ඇතුළත, නෞභාර බිල්පත් අනුව ඒ බඩුවල විවිධ නැව්ගත කරන්නන්ගේ නම් විශේෂ කොට දක්වමින්, ඒ ලැයිස්තුවේ හෝ නැව්බඩු ලේඛනයේ නිවැරදි ලිඛිත අනුලේඛනයක් අත්සන් කොට, වරායවල් පිළිබඳ අධිකාරියේ කාර්යාලයේ තැබිය යුතු ය.

(4) ඒ ලැයිස්තුව හෝ නැව්බඩු ලේඛනය පිළියෙල කිරීම හා එකී ලිඛිත අනුලේඛනය අත්සන් කොට භාරදීම පැහැර හරින එවැනි යම් අයිතිකරුවකු, කුලියට ගන්නා තැනැත්තකු, ප්‍රේෂණකරුවකු, අනුයෝජිතයකු හෝ වෙනත් තැනැත්තකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

**යාත්‍රා ආරක්ෂා සහිතව ඉවත් කිරීම පිණිස උපකරණ සජ්ජිත කොට තැබිය යුතු බව.**

81. (1) යම් නිශ්චිත වරායක වාප්පුවක් අද්දර තිබෙන හෝ නැව්තොට තුළ තිබෙන සෑම යාත්‍රාවක් ම වරායවල් පිළිබඳ අධිකාරියේ විනිශ්චය අනුව එය ඉවතට ගෙන යෑම කළ යුතු වන කවර අවස්ථාවක දී වුව ද ආරක්ෂා සහිතව ඉවත් කර යවනු ලැබීමට හැකි වන සේ, උපකරණ සජ්ජිත කොට, අවශ්‍යතා සපයා බඩු පටවා හෝ පිරවුම් ද්‍රව්‍ය පටවා, තබනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩකරන, නැවක යම් නෞකාධිපතියකු හෝ අයිතිකරුවකු වරදක් කරන අතර මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

**යාත්‍රාවක නෞකාධිපති, අයිතිකරු හෝ එය භාරව සිටින තැනැත්තා අලාභ සඳහා වගකිව යුතු බව.**

82. (1) යම් යාත්‍රාවකින් හෝ වාහනයකින් හෝ, එහි හෝ එහි ලා සේවයේ නියුක්ත කර ගනු ලැබ සිටින යම් තැනැත්තකුගෙන්, වරාය අධිකාරියේ යම් දේපළකට යම් අලාභයක් සිදුවන සෑම අවස්ථාවක දී ම ඒ අලාභය පියවීමේ වැය වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඒ යාත්‍රාවේ නෞකාධිපතිගෙන් හෝ ඒ යාත්‍රාවේ හෝ වාහනයේ අයිතිකරුගෙන් හෝ එය භාරව සිටින තැනැත්තාගෙන් අය කර ගනු ලැබිය හැකි ය.

(2) ඒ අලාභය පියවීමේ වියදම අධිකාරියට ගෙවනු ලබන තුරු හෝ ඒ මුදල වෙනුවෙන් අධිකාරියට ඇප තබන තුරු හෝ එවැනි යම් යාත්‍රාවක් හෝ වාහනයක් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් රඳවා ගනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියෙහි කාර්යයන් සඳහා 40 (2) වන වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

83. (1) මේ පනත යටතේ නියම කර ඇති යම් දණ්ඩනයකට යටත් වීමට යම් තැනැත්තකුට හේතු වූ, යම් ක්‍රියාවක්, නොසැලකිලිමත්කමක් හෝ පැහැර හැරීමක් නිසා, ඒ තැනැත්තාගෙන් අධිකාරියේ දේපළට යම් අලාභයක් සිදු වී නම්, ඔහු ඒ දණ්ඩනය ගෙවිය යුතුවාක් මෙන් ම ඒ අලාභය පියවීමට ද යටත් විය යුතු ය.

වරායවල් පිළිබඳ අධිකාරියේ දේපළකට සිදුවන අලාභ, දණ්ඩනයකට අතිරේකව, පියවිය යුතු බව.

(2) එම අලාභයේ ප්‍රමාණය සම්බන්ධයෙන් මතභේදයක් ඇති වුවහොත්, එකී දණ්ඩනයට යටත් වූ තැනැත්තා වරදකරු කරනු ලැබූයේ යම් අධිකරණයක් විසින් ද ඒ අධිකරණය විසින් ඒ මුදල නිශ්චය කළ යුතු අතර ඒ මුදල ඒ අධිකරණය විසින් නියම කරන ලද දඩයක් මෙන් අයකර ගනු ලැබිය හැකි ය.

84. (1) නැව් බඩු කිසිවක් යම් නිශ්චිත වරායක ස්ථානයේ මාස තුනකට වැඩි කාලයක් තිබෙන්නට හැර ඇත්තා වූ ද වරායවල් පිළිබඳ අධිකාරියේ මතය අනුව ඒ බඩු අත්හැර දමා තිබෙන බව හෝ අධිකාරියේ මාර්ගස්ථ මඩුවලට බාධාවක් වී තිබෙන බව හෝ පෙනී යන්නා වූද අවස්ථාවක, අධිකාරිය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ ටෙන්ඩර් කැඳවීමෙන් හෝ ඒ නැව්බඩු බැහැර කරනු ලැබිය හැකි අතර එවැනි යම් වෙන්දේසියකින් හෝ ටෙන්ඩර් කැඳවීමකින් පසුව ද නැව් බඩු නොවිකුණුනහොත් අධිකාරිය විසින් ඒ බඩු විකිණීම, බැහැර කිරීම හෝ විනාශ කිරීම කරනු ලැබිය හැකි ය :

අත්හැර දමා ඇතැයි පෙනී යන හෝ මාර්ගස්ථ මඩුවලට බාධාවක් වී තිබෙන නැව් බඩු බැහැර කිරීම.

එසේ වුව ද නැව් බඩු බැහැර කිරීම හෝ විකිණීම සම්බන්ධයෙන් ද ඒ බැහැර කිරීම හෝ විකිණීම සඳහා වූ ඒ නැව් බඩු පිළිබඳ තක්සේරු කිරීම සම්බන්ධයෙන් ද ප්‍රධාන රේගු අයකැමිගේ එකඟත්වය ලබා ගන්නා තුරු මේ වගන්තිය යටතේ ඒ නැව් බඩු විකිණීම හෝ බැහැර කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් බඩු විකිණීමෙන් ලත් මුදල 39 (6) වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයෙන් වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යෙදිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ගෙවීම් කිරීමෙන් පසුව, විකිණීමෙන් ලත් මුදලෙහි යම් ශේෂයක් වෙතොත්, ඊට හිමිකම් ඇති තැනැත්තා විසින් එය ඉල්ලූවිට ගෙවනු ලැබිය යුතු ය ; නැත හොත් බඩු විකුණූ දින සිට එක් අවුරුද්දක් ඇතුළත එවැනි ඉල්ලීමක් කරනු නොලැබූ අවස්ථාවක, පොදු ආදායමට ගෙවනු ලැබිය යුතු ය. එවිට ඒ තැනැත්තාට ඒ සඳහා ඇති සියලු අයිතිවාසිකම් අහෝසි වන්නේ ය.

85. (1) කොළඹ වරාය (පරිපාලන) පනත, 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංස්ථා පනත, හෝ 1967 අංක 10 දරන වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථා පනත යටතේ හෝ මේ පනතින් වරායවල් පිළිබඳ අධිකාරිය සතු කරන ලද කටයුතුවලට අදාළ වෙනත් ලිඛිත නීතියක විධිවිධාන යටතේ හෝ පිහිටුවන ලද,

අන්තර්කාලීන විධිවිධාන.

පිළියෙල කරන ලද, සාදන ලද, ප්‍රදානය කරන ලද හෝ අනුමත කරන ලද යම් අරමුදලක්, යෝජනා ක්‍රමයක්, ලේඛනයක්, බල පත්‍රයක් හෝ යම් විධානයක් හෝ යෝජනා සම්මතයක්, මේ පනතෙහි හෝ වෙනත් ලිඛිත නීතියක හෝ ප්‍රකාශිතව ම අන්‍යාකාර පිළිවිධාන සලස්වා ඇති අවස්ථාවක දී හැර, තවදුරටත් බලපැවැත් විය යුතු අතර එය, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ පිහිටුවන ලද, පිළියෙල කරන ලද, සාදන ලද, ප්‍රදානය කරන ලද හෝ අනුමත කරන ලද ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනත මගින් යම් ලිඛිත නීතියක් ඉවත් කරනු ලැබුව ද, ඒ ඉවත් කරන ලද නීතිය යටතේ සාදන ලද සෑම රීතියක්, නියෝගයක් හෝ නියමයක් ම නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි වලංගුව පැවතිණි නම් හා මේ පනතෙහි විධිවිධානවලට අනනුකූල නොවේ නම්, මේ පනත යටතේ සාදන ලද රීතියක්, නියෝගයක් හෝ නියමයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා බල පැවැත්විය යුතු ය ; තවද, මේ පනත යටතේ සාදනු ලබන, අවස්ථාවෝචිත පරිදි, යම් රීතියකින්, නියෝගයකින් හෝ නියමයකින් එය සංශෝධනය කිරීම, එය ප්‍රතියෝජනය කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි පැවති හා මේ පනත යටතේ වරායවල් පිළිබඳ අධිකාරිය හෝ එහි යම් සේවානියුක්තයකු සතු වූ වත්කම් හා වගකීම් කිසිවක් කෙරෙහි බලපාන සියලු ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, සාධන පත්‍ර සහ කාර්ය සංවිධාන, අවස්ථාවෝචිත පරිදි වරායවල් පිළිබඳ අධිකාරියට විරුද්ධව හෝ එහි වාසියට හෝ සම්පූර්ණයෙන් බලාත්විත හා බලපැමෙන් යුක්ත විය යුතු අතර, වරාය කොමසාරිස්වරයා, වරාය (නැව්බඩු) සංස්ථාව, වරාය සැපසුම් හා ආරක්ෂක සේවා සංස්ථාව, ආණ්ඩුව හෝ ඒ වෙනුවෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු වෙනුවට වරායවල් පිළිබඳ අධිකාරිය එහි නම් කරනු ලැබ ඇත්තාක් මෙන් හෝ එහි පාර්ශ්වකරුවකුව සිටියාක් මෙන්, සම්පූර්ණයෙන්ම හා බලසහිතව එය ක්‍රියාත්මක කළ හැකි විය යුතු ය.

(4) මේ පනත යටතේ හා එහි බලය ප්‍රකාර, වරායවල් පිළිබඳ අධිකාරිය වෙත පැවරුණු හා සතු වූ කර්තව්‍ය හෝ වත්කම් කිසිවක් සම්බන්ධයෙන් වරාය කොමිෂන් සභාව, වරාය (නැව්බඩු) සංස්ථාව හෝ වරාය සැපසුම් හා ආරක්ෂක සේවා සංස්ථාව විසින් හෝ එයට විරුද්ධව හෝ පවරන ලද හෝ පවරනු ලැබිය හැකිව තිබුණු සියලු නඩු කටයුතු, ඒවා නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි විනිශ්චයට භාජනව තිබිණි නම්, මේ පනතෙහි විධිවිධානවලට හා වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් හෝ එයට විරුද්ධව තවදුරටත් පවත්වාගෙන යා හැකි අතර, නියමිත දිනයට පෙර පවරනු ලැබ නොතිබිණි නම්, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් හෝ එයට විරුද්ධව හෝ පවරනු ලැබිය හැකි ය.

ඇතැම් නීති ඉවත් කිරීම හා පුළුවෙත් වෙනස් කිරීම.

86. (1) කොළඹ වරාය (පරිපාලන) පනත, 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංස්ථා පනත සහ 1967 අංක 10 දරන වරාය සැපසුම් හා ආරක්ෂක සේවා සංස්ථා පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) යම් නිශ්චිත වරායක කරන ලද හෝ නොකර හරින ලද නැතහොත් කරනු ලැබීමට නියමිත හෝ බලය දෙන ලද ක්‍රියා හෝ දේ සම්බන්ධයෙන් අදාළවීමේ දී පමණක් රේගු ආඥාපනත මෙහි පහත දැක්වෙන අනුවර්තනවලට, සුළු වෙනස් කිරීම්වලට සහ එකතුකිරීම්වලට යටත්ව බලපැවැත්විය යුතු ය. එනම් :—

(අ) යම් නිශ්චිත වරායක සීමා තුළ දී, වරායවල් පිළිබඳ අධිකාරියේ පාලනය යටතේ පවතින යම් ගුදමක් හෝ බඩු තැන්පත් කිරීමේ වෙනත් ස්ථානයක් සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ 15 වන වගන්තිය අදාළ නොවිය යුතු ය ;

(ආ) රේගු ආඥාපනතේ 24 වන වගන්තියේ විධිවිධාන යටතේ දණ්ඩන ගෙවීම ක්‍රියාත්මක කිරීමේ බලය තවදුරටත් ප්‍රධාන රේගු අයකැමි විසින් දැරිය යුතු ය යන සුළු වෙනස් කිරීමට යටත්ව, ඒ ආඥාපනතේ 23 වන, 24 වන සහ 25 වන වගන්ති යම් නිශ්චිත වරායක් සම්බන්ධයෙන් හා එහි සීමා ඇතුළත අදාළ නොවිය යුතුය ;

(ඇ) අවසරය දීමට වරායවල් පිළිබඳ අධිකාරියේ ඇති කැමැත්ත ඒ අධිකාරිය විසින් ලියවිල්ලකින් ප්‍රධාන රේගු අයකැමි වෙත දන්වනු ලබන තුරු, ඒ ආඥාපනතේ 34 වන වගන්තිය හෝ 62 වන වගන්තිය යටතේ අයකැමි විසින් ඒ අවසරය දෙනු නොලැබිය යුතු ය ;

ඒ ආඥාපනතේ 34 වන වගන්තියේ ජනරජයේ ගුදම පිළිබඳ සඳහන් කිරීමට ප්‍රධාන රේගු අයකැමි විසින් අනුමත කරන ලද වරායවල් පිළිබඳ අධිකාරියේ යම් ගුදමක් හෝ මාර්ගස්ථ මඩුවක් ඇතුළත් විය යුතු අතර මේ වගන්තිය යටතේ ගෙවිය යුතු යම් කුලියක් වරායවල් පිළිබඳ අධිකාරියට ගෙවනු ලැබිය යුතු ය ;

(ඈ) ඒ ආඥාපනතේ 37 වන වගන්තිය යම් නිශ්චිත වරායක් තුළ නැව්බඩු නැවකින් නැවකට මාරු කිරීම සම්බන්ධයෙන් අදාළවීමේ දී, නැවකින් නැවකට මාරු කිරීමේ වැඩ කටයුතු පිළිබඳ රේගු කාර්ය පටිපාටි අවේක්ෂා කිරීම සඳහා ප්‍රධාන රේගු අයකැමි තමා නියෝජනය කිරීමට එවන නිලධරයකු ඉදිරියේ වරායවල් පිළිබඳ අධිකාරිය විසින් එම කටයුතු කරනු ලැබිය හැකි ය යන සුළු වෙනසට යටත්ව, බලපැවැත්විය යුතු ය ;

(ඉ) ඒ ආඥාපනතේ 41 වන වගන්තිය වරායවල් පිළිබඳ අධිකාරියට අයිති යම් ගුදමක හෝ මාර්ගස්ථ මඩුවක තබන ලද බඩු සම්බන්ධයෙන් අදාළවීමේ දී, ගුදමක් තුළ සුරක්ෂිතාගාරයක හෝ වෙනත් ආරක්ෂා සහිත ස්ථානයක ගබඩා කර තැබීම අවශ්‍ය නම් එසේ ගබඩා කළ යුතු යයි නියම කිරීමේ බලය හැර අයකැමි වෙත පැවරී ඇති බලතල වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය යන සුළු වෙනස් කිරීමට යටත්ව, බලපැවැත්විය යුතු ය ;

(ඊ) ඒ ආඥාපනතේ 42 වන වගන්තිය වරායවල් පිළිබඳ අධිකාරියට අයිති යම් ගුදමක් හෝ මාර්ගස්ථ මඩුවක් තුළ ඇති යම් බඩු සම්බන්ධයෙන් කරනු ලබන යම් වරදක් කෙරෙහි

අදාළවීමේ දී, ඒ වගන්තියෙහි අයකැමි පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතුය යන සුළු වෙනස් කිරීමට යටත්ව, එය බලපැවැත්විය යුතු ය;

(උ) ඒ ආඥාපනතේ 60 වන වගන්තිය, ඇඩ්කිරීමේ නියෝග නිකුත් කිරීමේ බලය වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය යන සුළු වෙනස් කිරීමට යටත්ව, බලපැවැත්විය යුතු ය;

(ඌ) ඒ ආඥාපනතේ 102 වන වගන්තිය, රේගු ස්ථානයෙන් ඇතැම් භාණ්ඩ ඉවත් කරන ලෙස නියම කිරීම සඳහා රේගුවේ යම් නිලධරයකුට ඒ වගන්තියෙන් පැවරී ඇති බලය වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ලියවිල්ලකින් තත් කාර්යය සඳහා බලය දෙනු ලබන යම් නිලධරයකු විසින් ද ක්‍රියාත්මක කළ හැකි ය යන සුළු වෙනස් කිරීමට යටත්ව, බලපැවැත්විය යුතු ය;

(එ) ඒ ආඥාපනතේ 104 වන වගන්තිය, වරාය කොමසාරිස් වරයා පිළිබඳ එහි සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු යයි ද කොළඹ වරායේ ගුදම් පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරියේ පාලනය යටතේ පවතින යම් ගුදමක් හෝ මාර්ගස්ථ මඩුවක් පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු යයි ද යන සුළු වෙනස් කිරීමට යටත්ව, බලපැවැත්විය යුතු ය;

(ඒ) ඒ ආඥාපනතේ 116 වන වගන්තිය, පහත දැක්වෙන සුළු වෙනස්කිරීම්වලට යටත්ව, බලපැවැත්විය යුතු ය:—

(i) අයකැමි පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ii) නිසි රේගු නිලධරයා පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දෙන ලද යම් නිලධරයකු පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(iii) රුපියල් එක් සියයක් පිළිබඳ සඳහන් කිරීම රුපියල් එක් දහසක් පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඔ) ඒ ආඥාපනතේ 117 වන වගන්තිය, පහත දැක්වෙන සුළු වෙනස්කිරීම්වලට යටත්ව, බලපැවැත්විය යුතු ය:—

(i) අයකැමි පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ii) රුපියල් එක් සියයක් පිළිබඳ සඳහන් කිරීම රුපියල් එක් දහසක් පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(iii) අයකැමි විසින් වරායවල් පිළිබඳ අධිකාරිය වෙත යොමු කළ ලියවිල්ලකින් බඩුවල අඩු ම වෙන්දේසි මිල නියම කරනු ලබන තෙක් හා විකිණීම අනුමත කරනු ලබන තෙක් (මෙහි ලා සුළුවෙන් වෙනස් කරන ලද පරිදි) ඒ වගන්තිය යටතේ යම් බඩු විකිණීමක් නොකළ යුතු ය; තව ද තීරු බදු අය කැමිට බැර කරනු ලැබීමට යටත්ව එවැනි යම් විකිණීමක මුළු උපයාගත් මුදල ම ඒ වගන්තියෙහි විධිවිධාන සලස්වා ඇති පරිදි, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් යොදවනු ලැබිය යුතු ය;

(ඹ) ඒ ආඥාපනතේ 146 වන හා 147 වන වගන්ති මේ පනතේ II වන උපලේඛනයේ සඳහන් යම් වරදක් හෝ කඩ කිරීමක් සම්බන්ධයෙන අදාළවීමේ දී, පහත දැක්වෙන සුළු වෙනස් කිරීම්වලට යටත්ව බලපැවැත්විය යුතු ය :—

(i) 146 වන වගන්තියේ අතුරු වගන්තියේ ප්‍රධාන රේගු අයකැමි පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ii) නඩු පැවරීමක් අනුමත කිරීමට හෝ යම් වරදක් සමථයකට පත් කිරීමට 147 වන වගන්තිය යටතේ වන බලය වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය;

(iii) 147 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි ප්‍රධාන රේගු අයකැමි පිළිබඳ සඳහන් කිරීම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ක) ඒ ආඥාපනතේ 153 වන වගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, වරායවල් පිළිබඳ අධිකාරියේ ගුදමක හෝ මාර්ගස්ථ මඩුවක හෝ තබන ලද යම් බඩු වෙනුවෙන් ඒ ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ ගෙවිය යුතු හෝ යම් නිශ්චිත වරායක දී කරන ලද යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් 116 වන හෝ 117 වන වගන්තිය යටතේ ගෙවිය යුතු යම් දණ්ඩනයක මුදල, වරායවල් පිළිබඳ අධිකාරියට ගෙවනු ලැබිය යුතු අතර, (දරන ලද වියදම් කිසිවක් ඉන් අඩු කිරීමෙන් පසු) දැනුම් දෙන්නන් හා යෝග්‍ය සේවා නියුක්තයන් අතර අධිකාරියේ අභිමතය අනුව බෙදා හරිනු පිණිස, අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන තෑගි අරමුදලකට ගෙවනු ලැබිය යුතු ය;

(ග) වරායවල් පිළිබඳ අධිකාරියේ යම් ගුදමක හෝ මාර්ගස්ථ මඩුවක හෝ තබන ලද යම් බඩු සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ හෝ යම් නිශ්චිත වරායක දී කරන ලද යම් කඩ කිරීමක් සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ 116 වන හෝ 117 වන වගන්තිය යටතේ හෝ දරන ලද යම් අහිමි කිරීමක් හෝ දණ්ඩනයක් නැත හොත් යම් අහිමිකිරීමකට හෝ දණ්ඩනයකට යටත්වීමක් පිළිබඳ අවස්ථාවක දී ඉල්ලුම් කරනු ලැබූ විට, අමාත්‍යවරයා

විසින් ප්‍රතිශෝධනය කිරීමට යටත්ව, ඇඟිල් කිරීමේ බලය වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු ය යන සුළු වෙනස් කිරීමට යටත්ව ඒ ආඥාපනතේ 163 වන වගන්තිය බලපැවැත්විය යුතු ය.

(3) නැව්තොට සංවිධායක ආඥාපනත, නියමු ආඥාපනත, බෝට්ටු ආඥාපනත, රේගු ආඥාපනත, පොලිස් ආඥාපනත සහ බෝට්ටුකරු ආඥාපනත සහ ඒ යටතේ සාදන ලද රීති හා නියෝග යම් නිශ්චිත වරායක් සම්බන්ධයෙන් අදාළවීමේ දී, අවස්ථාවෝචිත පරිදි, නැව්තොට සංවිධායකවරයා හෝ වරාය කොමසාරිස්වරයා වෙත ඒ ආඥාපනත්වලින් ද රීතිවලින් හා නියෝගවලින් ද පවරන ලද හා නියම කරන ලද බලතල, කටයුතු හා කාර්ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම, වරායවල් පිළිබඳ අධිකාරිය විසින් කළ යුතු ය යන සුළු වෙනස් කිරීමට යටත්ව, බලපැවැත්විය යුතු ය ; තව ද ඒ අනුව, ඒ ආඥාපනත්වල සහ යම් රීති හා නියෝගවල නැව්තොට සංවිධායකවරයා හෝ වරාය කොමසාරිස්වරයා පිළිබඳ සෑම සඳහන් කිරීමක් ම වරායවල් පිළිබඳ අධිකාරිය පිළිබඳ සඳහන් කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනතෙහි විධිවිධාන රේගු ආඥාපනතේ විධිවිධාන වලට අතිරේකව බල පැවැත් විය යුතු බව.

87. මේ පනතේ විධිවිධාන රේගු ආඥාපනතේ විධිවිධාන හීන කරන විධිවිධාන වශයෙන් නොව ඒ විධිවිධානවලට අතිරේක විධිවිධාන වශයෙන් අර්ථනිරූපණය කළ යුතු ය.

මේ පනතේ විධිවිධාන වලින් ජනරජය බැඳෙන බව.

88. මේ පනතෙහි විධිවිධාන ජනරජයේ හෝ ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තු සම්බන්ධයෙන් අදාළ විය යුතු අතර ජනරජය හා ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තු මේ විධිවිධානවලින් බැඳී සිටිය යුතු ය.

අර්ථ නිරූපණය.

89. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අන්තරායදායක බඩු" යන්නට ඇසෙටොෆෙනෙටිස්, විට්රියෝල්, නැප්තා, බෙන්සීන්, වෙඩි බෙහෙත්, ලුසිෆර් ගිනිකූරු, නයිට්‍රෝග්ලිසරීන්, ඛනිජ තෙල්, කැල්සියම් කාබයිඩ් සහ පුපුරණ ද්‍රව්‍ය පනතේ අර්ථානුකූල යම් පුපුරණ ද්‍රව්‍යයක් ඇතුළත් වේ ;

"අයිතිකරු" යන්න බඩු සම්බන්ධයෙන් යෙදෙන විට, ඊට යම් ප්‍රේෂණකරුවෙක්, ප්‍රේෂණලාභියෙක්, නැව්ගත කරන්නෙක් හෝ ඒ බඩු විකිණීම, භාරව සිටීම, පැටවීම, ඒ පිළිබඳ පරිහරණ කටයුතු කිරීම, බෑම හෝ භාරදීම සඳහා වූ අයිතිකරුගේ අනුයෝජිතයෙක් ඇතුළත් වන අතර යම් යාත්‍රාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඊට යාත්‍රාවේ යම් හවුල් අයිතිකරුවෙක්, නැව් කුලියට ගන්නෙක් හෝ ක්‍රියාභාරවන්නෙක් හෝ එවැනි යම් තැනැත්තකුගේ යථා පරිදි බලය දුන් අනුයෝජිතයෙක් එයට ඇතුළත් වේ ;

"ආලෝකධාරා පහන" යන්නෙන් යාත්‍රාකරණයට ආධාර වශයෙන් යොදා ගනු ලබන, ප්‍රදීපාගාරයක් හෝ බෝයාවක් නොවන, යම් ප්‍රදීපයක්, සළකුණක් හෝ සංඥුවක් අදහස් වේ ;

"ඉඩම" යන්නට ජලයෙන් වැසුණු බිමක් සහ ඉඩම් පිළිබඳ යම් සම්බන්ධතාවක් ඇතුළත් වේ ;

"ගාස්තු" යන්නට වරායවල් පිළිබඳ අධිකාරියට ඉල්ලීමට, හැර ගැනීමට සහ අයකර ගැනීමට තත් කාලයෙහි බලය දී ඇති සෑම ආකාරයක ම ගාස්තු, බදු, අය කිරීම් හා ලැබිය යුතු මුදල් ඇතුළත් වන අතර "ගාස්තු අයකිරීම" යන්න ඒ අනුව තේරුම් ගත යුතු ය ;

"නෞකාධිපති" යන්නට, නියමුවා හැර, තත් කාලයෙහි යම් යාත්‍රාවක අණබලය, භාරය හෝ පාලනය දරන සෑම තැනැත්තෙක් ම ඇතුළත් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"බඩු" යන්නට සතුන්, සත්ව කුණප, ගමන් බඩු හා කවර ආකාරයේ වූ හෝ වෙනත් යම් චංචල දේපළක් ඇතුළත් වේ ;

"බෝයාව" යන්නට යාත්‍රාකරණයට ආධාර වශයෙන් යොදා ගනු ලබන, ප්‍රදීපාගාරයක් නොවන, යම් පාවෙන ප්‍රදීපයක්, සළකුණක් හෝ සංඥුවක් ඇතුළත් වේ ;

"මාර්ගස්ථ මඩුව" යන්නට වරායවල් පිළිබඳ අධිකාරියට අයිති හෝ වරායවල් පිළිබඳ අධිකාරිය පදිංචි වී ඇත්තා වූ සහ බඩු බෑම සහ නැව්ගත කිරීම සඳහා වරායවල් පිළිබඳ අධිකාරිය විසින් නතු කරගෙන ඇත්තාවූ සියලු ගොඩ නැගිලි, අංගන හා වෙනත් ස්ථාන ද එසේ අයිතිව ඇති හෝ පදිංචිව ඇති හා ඒ කාර්යයන් සඳහා පාවිච්චි කරනු ලබන යම් පෙරවෙරළක් ද ඇතුළත් වේ. එහෙත් එසේ අයිතිව නැති හෝ පදිංචි වී නැති පෙරවෙරළේ හෝ වෙනත් ස්ථානවල යම් කොටසක් එයට ඇතුළත් නොවිය යුතු ය ;

"යාත්‍රාව" යන්නෙන් යම් නැවක් හෝ බෝට්ටුවක් හෝ යාත්‍රා කරණයෙහි ලා යොදාගනු ලබන වෙනත් කවර ආකාරයක හෝ යාත්‍රාවක් අදහස් වේ ;

"වරාය කොමසාරිස්වරයා" යන්නෙන් කොළඹ වරාය (පරිපාලන) පනත යටතේ පත් කරන ලද වරාය කොමසාරිස්වරයා අදහස් වන අතර වරාය කොමසාරිස්වරයාගේ ලිඛිත බලය යටතේ ක්‍රියා කරන යම් නිලධරයෙක් ද එයට ඇතුළත් වේ;

"වරාය ස්ථානය" යන්නෙන් යම් විටක වරායවල් පිළිබඳ අධිකාරිය සතුව ඇති, එයට අයිති හෝ එය විසින් පරිපාලනය කරනු ලබන ගොඩබසින හා ගොඩබාන ස්ථාන, සහ වෙනත් සියලු කර්මාන්තශාලා හා බිම් අදහස් වේ;

"වරාය (නැව්බඩු) සංස්ථාව" යන්නෙන් 1958 අංක 13 දරන වරාය (නැව්බඩු) සංස්ථා පනත මගින් පිහිටුවන ලද වරාය (නැව්බඩු) සංස්ථාව අදහස් වේ;

"වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව" යන්නෙන් 1967 අංක 10 දරන වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථා පනත යටතේ පිහිටුවන ලද වරාය සැසඳුම් හා ආරක්ෂක සේවා සංස්ථාව අදහස් වේ;

"වාප්පුව" යන්නෙන් යම් වරාය වේදිකාවක්, ගොඩබසින හෝ ගොඩබාන පාලමක්, ජැටියක් හෝ ගොඩබසින හෝ ගොඩබාන වෙනත් ස්ථානයක් අදහස් වේ;

"ස්ටෙවඩෝරු වැඩ" යන්නෙන් යම් යාත්‍රාවක් තුළ හෝ එහි බඩු පොළවල්වල නැව්බඩු පැටවීම, බෑම, නැව්ගත කිරීම, නැවකින් නැවකට මාරු කිරීම සහ ගබඩා කිරීම යන මේවාට සම්බන්ධ වැඩ කටයුතු අදහස් වේ; තවද

"සැසඳුම් හා ආරක්ෂක සේවා" යන්නෙන් නැවක අයිතිකරුගේ, අනුයෝජිතයාගේ හෝ නෞකාධිපතිගේ ප්‍රයෝජනය පිණිස නැවේ හා ගොඩබිම සේවයෙහි නියුක්ත කරවනු ලැබ සිටින තැනැත්තන් විසින් ඉටු කරනු ලබන සැසඳීම් හා මුරකරුවන්ගේ සේවා සහ වෙනත් ආරක්ෂක සේවා අදහස් වන අතර කුවිතාන්සි භාරකරුවෝ, සහකාර කුවිතාන්සි භාරකරුවෝ, පරිපාලකයෝ, සැලසුම් ලිපිකරුවන් හා ගොඩබසින පාලම් ලිපිකරුවෝ ද එයට ඇතුළත් වෙති.

5 (3) වන වගන්තිය

## I වන උපලේඛනය

### වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයන් පිළිබඳ විධිවිධාන

1. යම් තැනැත්තෙක් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකුව සිටී නම් වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එහි සාමාජිකයකුව සිටීමට ඔහු නුසුදුස්සකු විය යුතු ය.

2. යම් තැනැත්තකු වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට පෙර අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍යයන් ඉටු කිරීම කෙරෙහි හානිකර ලෙස බල පෑ හැකි යම් මුදල් සම්බන්ධතාවක් හෝ වෙනත් සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතුය. තවද තමා විසින් පත් කරන ලද වරායවල් පිළිබඳ අධිකාරියේ සෑම සාමාජිකයකුට ම එවැනි සම්බන්ධතාවක් නොමැති බවට ද අමාත්‍යවරයා එවැනි සෑම සාමාජිකයකු සම්බන්ධයෙන් කලින් කල සෑහීමට පත් විය යුතුය. අධිකාරියේ සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ, නැතහොත් පත් කිරීමට අදහස් කරන යම් තැනැත්තකු මේ පනත යටතේ පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා තමාට අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන තොරතුරු ඔහු ඉල්ලූ විට ඔහු වෙත සැපයිය යුතු ය.

3. වරායවල් පිළිබඳ අධිකාරිය විසින් ඇති කරගන්නා ලද හෝ ඇතිකර ගැනීමට අදහස් කරන යම් ගිවිසුමක් පිළිබඳ කවර හෝ සම්බන්ධතාවක් කෙළින් ම හෝ අන්‍යාකාරයකින් ඇති එම අධිකාරියේ යම් සාමාජිකයකු, තමාගේ සම්බන්ධතාවේ ස්වභාවය අධිකාරියේ රැස්වීමක දී එළිදරව් කළ යුතුය. ඒ එළිදරව් කිරීම අධිකාරියේ වාර්තාවල වාර්තාගත කරනු ලැබිය යුතු අතර එම ගිවිසුම් සම්බන්ධයෙන් අධිකාරිය විසින් කරනු ලබන යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

4. (1) ප්‍රධාන රේගු අයකැමි, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයා සහ ධීවර කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයා ද හැර වරායවල් පිළිබඳ අධිකාරියේ අන් සෑම සාමාජිකයකු ම මේ උපලේඛනයෙහි 5 වන හා 6 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට ගණන් ගත යුතු හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ අමාත්‍ය වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් සිය ධුරය දැරිය යුතු අතර, මේ උපලේඛනයේ 5 වන වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සකු විය යුතු ය:

එසේ වුවද, ධුරය හිස් කරන සාමාජිකයකු වෙනුවට අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයකු කලින් සිය ධුරය හිස් කළහොත් මිස, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද එම සාමාජිකයාගේ ධුර කාලයෙන් ගත නොවී ඉතිරිව ඇති කොටස සඳහා ධුරය දැරිය යුතු ය.

(2) මේ උපලේඛනයේ 6 වන වගන්තියට යටත්ව, සභාපතිවරයාගේ හෝ උපසභාපතිවරයාගේ ධුර කාලය වරායවල් පිළිබඳ අධිකාරියේ ඔහුගේ සාමාජිකත්වයේ කාල සීමාව විය යුතු ය.

5. අමාත්‍යවරයා විසින් පත් කරන ලද වරායවල පිළිබඳ අධිකාරියේ යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් ඒ සඳහා කිසිදු හේතු නොදක්වා ඉවත් කරනු ලැබිය හැකි අතර, අවස්ථෝචිත පරිදි, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් හෝ ධීවර කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් හෝ නම් කරන ලද වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයා ඒ අමාත්‍යවරයා විසින් ඒ සඳහා කිසිදු හේතු නොදක්වා, ඉවත් කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින් හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයා හෝ ධීවර කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් හෝ කරන ලද එවැනි ඉවත් කිරීමක් කිසිම අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

6. අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයකුට අමාත්‍යවරයා වෙත ඒ සඳහා යවනු ලබන ලිපියකින් සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපතිවරයා වශයෙන් වූ හෝ උපසභාපතිවරයා වශයෙන් වූ ස්වකීය ධුරයෙන් කවර විටක වුවත් ඉල්ලා අස්විය හැකිය.

7. (1) වරායවල් පිළිබඳ අධිකාරියේ යම් සාමාජිකයකු රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයෙහි කාර්ය ඉටු කිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, එවිට—

(අ) ඔහු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයෙක් නම්, ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් වෙනත් තැනැත්තකු පත් කළ හැකි ය, නැතහොත්

(ආ) ඔහු මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයා නම් ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ අමාත්‍යවරයා විසින් මහා භාණ්ඩාගාරයේ වෙනත් නියෝජිතයකු නම් කළ හැකි ය, නැතහොත්

(ඇ) ඔහු ධීවර විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබූ සාමාජිකයා නම් ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට ඒ අමාත්‍යවරයා විසින් අමාත්‍යාංශයේ වෙනත් නියෝජිතයකු නම් කළ හැකි ය, නැතහොත්

(ඈ) ඔහු ප්‍රධාන රේගු අයකැමි නම්, තත්කාලයෙහි ඔහු වෙනුවෙන් ක්‍රියා කරන නිලධරයා විසින් වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයකු වශයෙන් ක්‍රියා කළ හැකි ය.

(2) වරායවල් පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා හෝ උපසභාපතිවරයා රෝගාතුර වීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ ස්වකීය ධුරයෙහි කාර්යය ඉටුකිරීමට තාවකාලිකව අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ වෙනත් යම් සාමාජිකයකු, අවස්ථාවෝචිත පරිදි, සභාපතිවරයා හෝ උප සභාපතිවරයා හෝ වශයෙන් වැඩ බැලීමට අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

8. වරායවල් පිළිබඳ අධිකාරියේ සියළුම සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික, දීමනා හා වෙනත් වියදම් වරායවල් පිළිබඳ අධිකාරියේ මුදල් වලින් ගෙවනු ලැබිය හැකිය.

9. වරායවල් පිළිබඳ අධිකාරියේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතුය. වරායවල් පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා අධිකාරියේ සියළුම රැස්වීම්වල දී මුලසුන දැරිය යුතුය. අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විට අධිකාරියේ උපසභාපතිවරයා මුලසුන දැරිය යුතු අතර, අධිකාරියේ යම් රැස්වීමකට සභාපතිවරයා සහ උපසභාපතිවරයා යන දෙදෙනාම පැමිණ නොමැති විට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරෙන් යම් තැනැත්තකු මුලසුන දැරීමට තෝරාගත යුතුය.

10. මේ උපලේඛනයෙහි වෙනත් විධිවිධානවලට යටත්ව වරායවල් පිළිබඳ අධිකාරිය විසින් වරායවල් පිළිබඳ අධිකාරියේ රැස්වීම්වල හා එම රැස්වීම්වල කටයුතු කිරීම ද පිළිබඳ ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරගත හැකිය.

11. වරායවල් පිළිබඳ අධිකාරියේ මුද්‍රාව වරායවල් පිළිබඳ අධිකාරියේ සභාපතිවරයා භාරයේ තිබිය යුතු අතර, සභාපතිවරයාගෙන් හෝ උපසභාපතිවරයාගෙන් සමන්විත විය යුතු ඒ අධිකාරියේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර ඒ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ නොයෙදිය යුතුය. එම සාමාජිකයන් දෙදෙනා තමන් සිටි බවට සාක්ෂි වශයෙන් එම සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතුය. අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකිය.

12. වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබිය දී වුවද වරායවල් පිළිබඳ අධිකාරියට ක්‍රියා කළ හැකිය. වරායවල් පිළිබඳ අධිකාරියේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමෙහි හෝ නම් කිරීමෙහි ලා හෝ යම් දෝෂයක් තිබීම පමණක් හේතු කොට ගෙන අධිකාරියේ යම් ක්‍රියාවක් හෝ රැස්වීමක කටයුතු අවලංගු නොවිය යුතු ය.

## II වන උපලේඛනය

### 86 (2) (ඔ) වන වගන්තියෙහි සඳහන් වැරදි

1. වරායවල් පිළිබඳ අධිකාරියේ යම් ගුදමක තබන ලද බඩු සම්බන්ධයෙන් කරන ලදැයි කියනු ලබන රේගු ආඥාපනතේ 42 වන වගන්තියෙහි සඳහන් යම් වරදක්.

2. යම් නිශ්චිත වරායක් තුළ දී කරන ලදැයි කියනු ලබන, රේගු ආඥාපනතේ පහත දැක්වෙන වගන්ති අතුරෙන්, එනම් 102 වන, 104 වන, 116 වන සහ 117 වන වගන්ති අතුරෙන් යම් වගන්තියකට විරුද්ධ යම් වරදක් හෝ ඉන් යම් වගන්තියක් කඩකිරීම.